ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"ස්වාමීන්වහන්ස, මහන්තත්ත්වයද, පරාක්‍රමයද, තේජසද, ජයද, මහිමයද, අයත් ඔබටය...." (1 ලේකම් 29:11)

84 වන වෙළුම අංක 03 (981) 2025 මැයි / ජූනි මාස

බලවත් වූ අපගේ දෙවියන් වහන්සේ

මෙන්න, දෙවියන් වහන්සේ බලවත්ය. එහෙත් කිසිවෙකු සුළු නොකරන සේක. උන්වහන්සේ ඥානශක්තියෙන් බලවත්ය." (යෝබ් 36:5)

දෙවියන් වහන්සේ බලවත්ය. එනම් දෙවියන් වහන්සේ කොයිතරම් ශක්තිමත්ද කියනවා නම් මැනිය නොහැකි සහ සිතාගත නොහැකි බලය උන්වහන්සේට අයත් වේ. **"දෙවියන් වහන්සේ වට එක්වරක් කී සේක. වම වෙය දෙවරක් ඇසීවි. එනම්, බලය දෙවියන් වහන්සේට අයිති බවත් ස්වාමීනි, කරුණාවන් ඩබට අයිති බවත්ය. වක්නිසාද ඩබ එක එක මනුෂ්‍යයාට ක්‍රියාවේ හැටියට ප්‍රතිවල දෙන සේක."** (ගීතාවලිය 62 : 11-12) දෙවියන් වහන්සේ දැනටමත් කර ඇති සියල්ලෙන් උන්වහන්සේගේ බලය සනාථ කරයි. නමුත් උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨතම ක්‍රියාවලින් පවා උන්වහන්සේට තවමත් කළ හැකි දේ අපට අනුමාන කළ නොහැකිවේ.

"වේ වනාහී උන්වහන්සේගේ මාර්ගවල අල්පමාත්‍රයක් පමණකි. එයින් අපට ඇසෙන්නේ කොයිතරම් හීන් ශබ්දයක්ද ? එසේ නම් උන්වහන්සේගේ පරාක්‍රමයේ ගර්ජනාව තේරෙන්නේ කාටදැයි කීවේය." (යෝබ් 26:14)

සියලු බලය පැමිණෙන්නේ උන්වහන්සේගෙන්ය.

දෙවියන් වහන්සේ සමඟ කළ නොහැකි කිසිවක් නැත. පහත සඳහන් කරුණුවලින් උන්වහන්සේගේ බලයෙන් යම් ප්‍රමාණයක් ඉගෙනගන්න. ප්‍රථමයෙන්, විශ්වයේ ඇති සියලුම බලය මුලින්ම දෙවියන් වහන්සේගෙන් පැමිණියේය. තවමත් උන්වහන්සේගෙන් පැමිණෙන්නා වූ එම බලය උන්වහන්සේගේ ආඥාව පරිදි එක මොහොතකින් නතරවනු ඇත. උන්වහන්සේ ස්වභාව ධර්මයේ චක්‍රය චලනයවීමට සැලැස් වූ අතර උන්වහන්සේගේ අණ පරිදි එය භ්‍රමණයවීම නතරවනු ඇත. කෙරුබ්වරුන්, සෙරාෆ්වරුන්, දේවදූතයන් හෝ මනුෂ්‍යයන් තුළ කුමන මානසික හැකියාවක් තිබුණත් එය උන්වහන්සේගේ නිර්මාණාත්මක ශක්තියෙන් ලැබෙන හැටගැනීමක් පමණි. උන්වහන්සේ තම බලය පාලනය කළහොත් ඒවා නතරවනු ඇත. උන්වහන්සේට අවශ්‍යය නම් කේන්ද්‍රවී ඇති ගෝලය වටා භ්‍රමණය වන දැවැන්ත කක්ෂ කිහිපයක් නොවැලැක්විය හැකි ලෙස විනාශය කරා ව්‍යාකූලත්වයෙන් වේගයෙන් දිවයාමට සැලැස්විය හැකිය. ස්වභාව ධර්මයේ නීතිය බලයක් බවට පත්කර බලය උන්වහන්සේ ඉවත් කළහොත් සියල්ල ඒවායේ ස්ථානවල තබාගන්නා වූ ගුරුත්වාකර්ෂණයේ නියමය ක්ෂණයකින් බිඳී යනු ඇත. පරමාණු අතර සහජීවනයක් නොතිබෙනු ඇත. සියල්ල දියවීගොස් සොහොන් ගෙයක් බවට පත්වනු ඇත. විශ්වයම හිස් බවක් ඉතිරිකරනු ඇත. උන්වහන්සේගේ මෙම බලය කොයිතරම් විශාලද ? අපි නෙහෙමියා සමඟ මෙලෙස හඬා වැටෙමු. "ඔබම, ඔබ පමණක්ම ස්වාමීන් වහන්සේය. ඔබ ස්වර්ගය සහ ස්වර්ගවල ස්වර්ගයද එහි සියලු සේනාවන්ද පොළව සහ එහි මතුපිට ඇති සියල්ල ද සමුද්‍රය සහ එහි ඇති සියල්ල ද මැවූ සේක. ඔබම ඒ සියල්ල රක්ෂණය කරන සේක. ස්වර්ග සේනාවද ඔබට නමස්කාර කෙරෙති." (නෙහෙමියා 9:6)

බලවත් වූ දෙවියන් වහන්සේට කිසිවෙකුගේ උදව් නොමැතිව සියල්ල කළ හැකිය. උන්වහන්සේට කිසිඳු මැවිල්ලකින් උදව් අවශ්‍ය නොවේ. ඇත්තටම එවැනි උපකාරයක් තිබිය නොහැකිය. මක්නිසාද අනිත් සියලුම ජීවීන්ගේ සියලු බලය උන්වහන්සේගෙන් පමණක් ලබාගෙන ඇත. මැවිල්ල උන්වහන්සේගේ ශක්තියට දායකත්වයක් දක්වන්නේ නැත. මැවිල්ල උන්වහන්සේව ප්‍රකාශ කරනු ලබයි. ඔවුන් උන්වහන්සේගෙන් ලබාගත් බලය හෙළිදක්වන්නෝය. එපමණක් ද නොව, උන්වහන්සේ මැවූ සියලු දේ උන්වහන්සේට විරුද්ධවූවත් උන්වහන්සේගේ සියලු අරමුණු උන්වහන්සේට පහසුවෙන් ඉටු කළ හැකිය. නිර්මාණය කර ඇති සියලුම බලවතුන් කැරළි ගැසූවද එය උන්වහන්සේගේ බලයේ උත්තරීතරභාවයට කිසිඳු වෙනසක් සිදු නොකරයි. ස්වර්ගයේ වැඩ සිටින තැනැත්තන් වහන්සේ ඔවුන් සමච්චලයට ලක්කරන සේක. උන්වහන්සේට විරුද්ධව තම ධජය ඔසවා ඇති බලවතුන් පවා උන්වහන්සේගේ පාලනය යටතේ සිටිති. උන්වහන්සේගේ සතුරන් උන්වහන්සේගේ පාපුටුවයි. ඔවුන්ගේ ප්‍රකෝපකාරී බව ඉදිරියේ උන්වහන්සේ තම සාමකාමී අරමුණු ගෙනඑන සේක. **"සැබවින් මනුෂ්‍යයාගේ උදහසින් ඩබට ප්‍රශංසා ලැබෙන්නේය. උදහසේ ඉතිරි කොටස ඩබ ආයුධකොට බැඳගන්නා සේක."** (ගීතාවලිය 76:10)

දෙවියන් වහන්සේ වෙහෙසට පත්නොවන සේක

දෙවියන් වහන්සේ තමන් කැමති සියල්ල කළ පසු උන්වහන්සේ තම ශක්තිය වැය කර නැති බව හොඳින් සලකන්න. **"පොළොවේ සීමාවල මැවුම්කාර ස්වාමීන් වහන්සේ වන සදාකාල දෙවියන් වහන්සේ ක්ලාන්ත නොවන බවත්. වෙහෙස නොවන බවත්. නුඹ දන්නේ නැද්ද ..? නුඹ අසාලා නැද්ද ..? උන්වහන්සේගේ ඥානය දැනගෙන්ට බැරිය."** (යොසායා 40:28) දෙවියන් වහන්සේ සෑමවිටම බලා සිටින සේක. නමුත් නිදා ගැනීමට අවශ්‍යවන පරිදි උන්වහන්සේ කිසිවිටෙකත් වෙහෙසට පත්නොවන සේක. උන්වහන්සේ සෑමවිටම ක්‍රියා කරන සේක. නමුත් කිසිම වෙහෙසට පත්වීමක් නිසා උන්වහන්සේ විවේක නොගන්නා සේක. උන්වහන්සේ කිරීමට අදහස් කළ සියල්ල කළ පසුවත් උන්වහන්සේ පෙරදී මෙන් වැඩ කිරීමට සූදානම්ව සිටින සේක. අපගේ සංකල්පවලට අනුව උන්වහන්සේ ශක්තියේ උපරිමයට ගිය විය උන්වහන්සේ ආරම්භයේදීමෙන් සිටින සේක. මේවා උන්වහන්සේගේ වස්ත්‍රුවල දාවල්ල මෙන්වේ. නමුත් උන්වහන්සේගේ සම්පූර්ණ මහිමය නොපෙනේ. මම එතරම් දන්නෙ නැති මේ දේ ගැන කථා කරන අතර මම වෙව්ලමින් සිටිමි. නමුත් නිසැකවම දෙවියන් වහන්සේ වඩාත් බලවත්ව, වඩාත්ම පුළුල්ව සිටින අතර මිනිසාගේ හදවතට දැනෙන්නා වූ සියල්ලට වඩා ඉහළින් ක්‍රියාකරන සේක.

දෙවියන් වහන්සේ ප්‍රඥාවෙන් බලවත්ව සිටින සේක

ඉහතින් සඳහන් කළ බයිබල් පදයෙන් අපට පෙන්වන්නේ, "දෙවියන් වහන්සේ ශක්තියෙන් හා ප්‍රඥාවෙන් බලවත්ව සිටින බවයි." එබැවින් දෙවියන් වහන්සේ මනසින් බලවත් බව අපි සලකා බැලිය යුතුය. **"උන්වහන්සේගේ දැන ගැන්ම කෝදිසි කළ නොහැකිය."** උන්වහන්සේ නිර්මාණය කරන, සංස්කරණය කරන හෝ විනාශ කරන භෞතික බලය පමණක් නොව දැනගැන්මේ ඉහළම බලයද උන්වහන්සේ සතුව පවතින සේක. **"වේකන් සේනාවල ස්වාමීන් වහන්සේගෙන් පැවිණෙයි. උන්වහන්සේ වන්ත්‍රණයෙන් අසූරුව ප්‍රඥාවෙන් උතුම්ව සිටින සේක."** (යොසායා 28:29) **"අපේ ස්වාමීන්වහන්සේ උතුම්ය. මහා බලයෙන් යුක්තය උන්වහන්සේගේ ඥානය අනන්තය."** (ගීතාවලිය 147:5) දෙවියන් වහන්සේ ආත්මයක් බැවින් මගේ අර්ථකතනය ප්‍රකාශ කිරීමට වචන සොයා ගැනීම අසීරුව තිබේ. නමුත් උන්වහන්සේට මනසක් සහ බුද්ධියක් ඇති බව ප්‍රකාශ කර එම ක්ෂේත්‍රයේ මෙන්ම භෞතික ලෝකයේද සර්වබලධාරිව සිටින සේක. මෙය උන්වහන්සේගේ මැවිලිවල ආරක්ෂාවයි. දෙවියන් වහන්සේ ශ්‍රේෂ්ඨ වූ මනසක් ඇති දෙවියන් වහන්සේය. දෙවියන් වහන්සේට ශ්‍රේෂ්ඨ සිතුවිලි, ශ්‍රේෂ්ඨ සැලසුම්,

2 පිටුවට

1 පිටුවෙන්

බලවත් වූ අපගේ දෙවියන්...

ශ්‍රේෂ්ඨ ප්‍රඥාව, ශ්‍රේෂ්ඨ යහපත්කම තිබෙන සේක.

දෙවියන් වහන්සේ කිසිවක් පහත්කොට නොසලකන සේක

දැන් මූලධර්මයේ කාරණය මෙහි පවතියි. එනම් දෙවියන් වහන්සේගේ බලය නිසා උන්වහන්සේ කිසිවක් හෙළා නොදකින සේක. සාක්ෂි ඉතා පැහැදිලිය. දෙවියන් වහන්සේ කොයිතරම් ශ්‍රේෂ්ඨ හා බලවත් ද කියනවා නම් අනිත් සියල්ල උන්වහන්සේට කුඩාව තිබේ. දෙවියන් වහන්සේට වඩා ශ්‍රේෂ්ඨ කිසිවක් නොමැත. මිනිස් ගණනය කිරීම්වලට ඒවායේ ප්‍රමාණය තක්සේරු කළ නොහැකි තරම් විශාල ග්‍රහලෝක තිබේ. ඒවා අපට ගණන් කළ නොහැකි තරම් අධිකව තිබේ. නමුත් වෙන් වෙන් තාරකා මණ්ඩල සම්පූර්ණයෙන්ම ගණන් ගත්තත් මේ සියල්ල උන්වහන්සේට භාජනයක ඇති දිය බිංදුවක් මෙන් වේ. සියල්ල දෙවියන් වහන්සේ ඉදිරියේ ඉතා සුළු දේවල් බැවින් අපි සිතන අනෙකුත් දේවලට වඩා උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ඉහළින් පවතින බව පෙනීයයි. මක්නිසාද උන්වහන්සේව වෙන කිසිවක් සමඟ සන්සන්දනය කළ නොහැකිය.

දෙවියන් වහන්සේ කුඩා දේවල් සලකන බවට සාක්ෂි අවශ්‍ය නම් මැවිල්ල දෙස බලන්න. ශ්‍රේෂ්ඨ සහ බලවත් දෙවියන් වහන්සේ තමන්වහන්සේ විසින් නිර්මාණය කරන ලද විශ්මය ජනක ලෝකවල මෙන්ම තමන්වහන්සේ විසින් නිර්මාණය කරන ලද කුඩා වස්තූන් තුළ ද තමන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ප්‍රදර්ශනය කර තිබෙන සේක. ගලානොයන නිශ්චල දියබිංදුවක ගණන් කළ නොහැකි තරම් ජීවීන් නිර්මාණය කර තිබේ. ඒ සෑම දෙයක් තුළම උන්වහන්සේගේ සර්වබලධාරිත්වය ප්‍රකාශ වේ. එම කුඩා ජීවීන්ගේ සෑම ශරීර කොටසකට විශ්මිත වූ කුසලතාවයක් සහ ප්‍රශංසනීය නිර්මාණයක් පෙන්නුම් කරයි. ඒවායේ සියුම් බව අපගේ පුදුමය වැඩිකරන අතර දිව්‍යමය මැවුම්කරුවාණන්ගේ බලය දැන ගැනීමට අපව පොළඹවනු ලබයි.

දෙවියන් වහන්සේ කුඩා කෘමියෙක් ගැන වුවත් සියල්ල දකින සේක. එමෙන්ම දෙවියන් වහන්සේ සෙරාෆිවරුන් සහ කෙරුබ්වරුන් දෙස බලා සිටින ආකාරයටම පණුවා සහ ඇළදොලවල කුඩා මාළුවන්ද ආරක්ෂා කරන සේක. සන්සුන්ව නිර්මාණය කර ඇති දැවැන්ත නිර්මාණවලදී මෙන්ම මිනිත්තුවකින් ගොඩනගන්නා වූ කුඩා දේවලදී ද උන්වහන්සේගේ මනසෙහි තිබූ දේ බොහෝ පැහැදිලිව ප්‍රකාශ කර තිබෙන සේක. දෙවියන් වහන්සේ එසේ කර තිබෙන සේක් නම් උන්වහන්සේ මනුෂ්‍යයන් අතර අසරණයන් සහ දිළිඳුන් සමඟ මෘදු ලෙස කටයුතු කරන බවත්, අවංක හදවතකින් උන්වහන්සේව සොයන කිසිවෙකුව හෙළා නොදකින බවත් අපි අවබෝධ කරගනිමු. උන්වහන්සේ කුඩා කෘමීන්ව රැකබලා ගන්නා වූ තැනැන්වහන්සේ වන අතර නිහතමානී හදවත්වල යාච්ඤාවලට සවන්දෙමින් නූගත් සහ අපැහැදිලි දේ නොසලකා හරින්නේ නැත. දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන යෙසුස් වහන්සේ මෘදු නිහතමානී හදවතක් ඇතිව කුඩා දරුවන්ට තමන්වහන්සේ වෙතට පැමිණෙන්නට ඉඩ සලසා දුන් සේක. එබැවින් මනුෂ්‍යයන් අතර ඉතා සුළු වන අපව කිසිසේත් හෙළානොදකින සේක.

කුඩා දේවල් ගැන දක්වන එම ගෞරවය දේවාරක්ෂාව තුළ දැකිය හැකිය. දෙවියන් වහන්සේගේ දේවාරක්ෂාව බලවත් අධිරාජ්‍යයන් අතර යුද්ධවලදී කැබිනට් මණ්ඩල සහ රාජකීය මන්ත්‍රණ සභා සාකච්ඡාවලදී පමණක් නොව එහි පාලනයේ සිදුවන සියල්ල තුළ වටහාගත හැකිය. තණබිම්වල මිලියන සංඛ්‍යාත ඩෙසිමල් පිපීම සදාකාලික අරමුණකින් සකස්කර ඇති අතර වගුරුබිමේ ගෙම්බෙකුගේ කෑගැසීම හෝ වනාන්තරයේ ඕක් ගසකින් කොටසක් වැටීම සදාකාලික ප්‍රඥාවේ සැලැස්මේ කොටසකි. සෑම වැහැළිහිණියෙකුගේම සංක්‍රමණය කොලම්බස්ගේ ගමන තරම් සැලසුම්කර ඇත. දැලකට හසුව සිටින පක්ෂියෙකුව නිදහස් කිරීම ජාතියක විමුක්තිය තරම් නිසැකවම නියමකර ඇත. දෙවියන් වහන්සේ සෑම දෙයකම සිටින සේක. උන්වහන්සේ නොදැන ගේ කුරුල්ලෙකු බිම වැටෙන්නේ නැත. උන්වහන්සේ ඔබගේ සියලු හිස කෙස් ගණන්කර තිබෙන සේක. මෙම කුඩා දේවල් ඇතුළත් කර ඒවා උන්වහන්සේගේ සදාකාලික අරමුණේ කොටසක් බවට පත්කිරීමට යොමුවන බලයකින් වඩාත් පැහැදිලිව ඔප්පුකරන්නේ දෙවියන් වහන්සේ කිසිවෙකුට හෙළානොදකින බවයි.

දෙවියන් වහන්සේ වඩාත් අනුග්‍රහය දක්වා ඇත්තේ කුමන ආකාරයේ මනුෂ්‍යයන්ටද යන්න ගැන ඔබ සිතන විට මෙය වඩාත් පැහැදිලි වේ. උන්වහන්සේ තෝරාගත් අය කවුද ..? දෙවියන් වහන්සේගේ සමීපතම ප්‍රේමය මේ පොළොවේ ශ්‍රේෂ්ඨයන්ට කලාතුරකින් වැටී ඇති බව මතක තබාගන්න. **“මක්නිසාද සහෝදරයෙනි, නුඹලාගේ කැඳවීම, එනම් මාංසය ලෙස ප්‍රඥාවන්ත බොහෝ දෙනෙකුවත් බලවන්ත බොහෝ දෙනෙක්වත් වංශවත් බොහෝ දෙනෙක්වත් කැඳවනු නොලැබූ බව බලාපල්ලා”** (1 කොරින්ති 1:26) **පාවුල් තවදුරටත් කොරින්තිවරුන්ට ලියා යැවූවේය. “නුමුත් දෙවියන් වහන්සේ ප්‍රඥාවන්ත සේක. දෙවියන් වහන්සේ ශක්තිමත් දේ ලැජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ දුර්වල දේවල් තෝරාගත් සේක. ඇත්තා වූ දේවල් ඇති කරන පිණිස නැති දේවල් වැනි ලෝකයේ පහත් දේවල් ද, සුළුකොට සිතනු ලබන දේවල් ද දෙවියන් වහන්සේ තෝරාගත් සේක. ”** (1 කොරින්ති 1:27-28) උන්වහන්සේ කිසිවෙකු හෙළානොදකින සේක. මක්නිසාද යේසුස් වහන්සේ තම සෙනඟ අතරේ නායකයන්වීමට ගෝලයන් දොළොස්දෙනෙකු තෝරාගත් විට උන්වහන්සේ මෙම තනතුරට තෝරාගත්තේ දාර්ශනිකයන්, සෙනට්සභිකයන් හෝ රජවරුන් නොව පහත් ධීවරයන්ය. එතැන් සිට අද දක්වා මනුෂ්‍යයන් අතර සුළුකොට සැලකූ අය තෝරාගෙන ඔවුන් උන්වහන්සේගේ සෙනඟ වෙනුවෙන් උන්වහන්සේගේ බලවත්ම ක්‍රියාවන් ඉටු කිරීමට උන්වහන්සේ සතුටුවූසේක. මක්නිසාද උන්වහන්සේ කිසිවෙකු හෙළා නොදකින තරම් බලවත්ව සිටින සේක.

සහෝදරයෙනි, ඔබගෙන් සමහරෙක් උන්වහන්සේ කිසිවෙකුට හෙළා නොදකින බවට මිහිරි සාක්ෂියක් බව ඔබ දන්නේය. මක්නිසාද ගීතාවලියේ දාවිත් කියන ආකාරයට ඔබටත් මෙසේ පැවසිය හැකිය. **“මක්නිසාද උන්වහන්සේ විපත් පැවිණි තැනැත්තාගේ විපතට නින්දා නොකළ සේක. එය පිළිකුල්කොට නොසිතූ සේක. ඔහු කෙරෙන් තමන් මුහුණ සඟවා නොගත් සේක. ඔහු හඬා ගැසූ කළ උන්වහන්සේ ඇසූ සේක.”** (ගීතාවලිය 22:24) ඔබගෙන් සමහරෙක් ශාරීරික වේදනාවලට, වියෝවීම්වලට හසුව සිටිනවා විය හැකිය. නමුත් දෙවියන් වහන්සේ ඔබට අත්නාරින සේක. ඔබගේ විපත්ති කාලයේ දී උන්වහන්සේ ඔබට ඉතා සමීපව සිට ඇති අතර එමගින් උන්වහන්සේ කිසිවෙකුව හෙළා නොදකින බවට ඔප්පු කර ඇත. **“වේ සියල්ල මාගේ අතින් සාදන ලද්දේය. එසේ වේ සියල්ල සිදුවී යයි ස්වාමීන් වහන්සේ කියන සේක. එහෙත් යටහත් වූ තැළුණු ආත්මයක් ඇත්තා වූ, මාගේ වචනයට වෙව්ලන්නා වූ මනුෂ්‍යයා දෙස බලමි.”** (යෙසායා 66:2)

දැන් සහෝදරයෙනි, ස්වාමීන් වහන්සේ කුඩා දේවල් සහ පහත් දේවල් දෙස බලන බවට මා ඔබට දී ඇති සාක්ෂිය උන්වහන්සේගේ ආත්මයේ ශ්‍රේෂ්ඨත්වය ප්‍රකාශ කරනු ලබයි. උන්වහන්සේ බලයෙන් ඉතා ශ්‍රේෂ්ඨ වන අතර උන්වහන්සේගේ සිතුවිලි ඉතා ගැඹුරුව, ප්‍රඥාවන්තව තිබෙන බැවින් උන්වහන්සේ සියල්ලන්ගේම අවශ්‍යතාවයන් දෙස බලන සේක. **“ස්වාමීන්වහන්සේ සියල්ලන්ට යහපත්ය. උන්වහන්සේගේ දයාබර්කම් උන්වහන්සේගේ සියලු කර්මාන්ත කෙරෙහිය.”** (ගීතාවලිය 145:9)

දෙවියන් වහන්සේ ඔබට ප්‍රේමකරන අතර ඔබව අගේකරන සේක

මෙය පරීක්ෂාකරනු ලැබූවන්ව බෙහෙවින් ධෛර්යමත් කරනු ලබන්නේය. මාගේ ආදරණීය මිතුරාණි, ඔබ යෝබ් මෙන් දුහුවිල්ලෙහි වැතිරී මැටිකැබැල්ලකින් තමාගේ තුවාල කැසීම තරම් අසීරු තත්ත්වයකට පැමිණ නැත. ඔබට එසේ සිදුවූවද දෙවියන් වහන්සේ ඔබව හෙළා නොදකින බව තේරුම්ගත යුතුය. ක්‍රිස්තුස් වහන්සේ උදෙසා මරණයට පත්වෙන කිසිවෙකුව උන්වහන්සේ හෙළා නොදකින සේක. ස්වාමීන් වහන්සේ ඔබව පිළිකුල්කොට ඔබ ගැන කිසිවිටෙකත් මෙසේ පවසන්නේ නැත. “එයාට දුක්විඳින්න දෙන්න. එයා මගේ කවුරුත් නෙවෙයි. ඔහුට කුමක් වුවත් කමක් නැහැ.” ඊට පටහැනිව අද ඔබට මුහුණදීමට සිදුවී තිබෙන වේදනාව කුමක් වුවත් ඔබට ඒවා ලබාදී ඇත්තේ අසීමිත ප්‍රඥාවෙන් සහ අතිමහත් ප්‍රේමයෙන්ය. මෙම කාරණාවලට හේතුව සහ සියලු දිව්‍ය අරමුණු ඔබ ඉදිරියෙහි විදහා දැක්විය හැකි නම්, දෙවියන් වහන්සේට මෙන් ඔබට පැහැදිලි අවබෝධයක් ඇත්නම් පියාණන් වහන්සේගේ කාරණා නිවැරදි සහ යහපත් බැවින් ඔබ දැන් සිටින ස්ථානයේම ඔබ සිටිනු ඇත. උන්වහන්සේ ඔබව ගිනි උදුනේ තැබුවේ ඔබව හෙළාදකින නිසා නොව උන්වහන්සේ ඔබව අගේකරන නිසාය. උන්වහන්සේ ඔබව යේසුස් වහන්සේගේ ලේ වලින් මිලදීගත් බැවින් උන්වහන්සේ ඔබට දීමනා පිරිනමන බවට ඔබට සහතික විය හැකිය.

ඔබේ වේදනාවේදී ඔබට අමතක කිරීමට තරම් ස්වාමීන්වහන්සේ ඔබ ගැන සුළුකොට නොසිතන සේක. ඔබගේ වේදනාවේදී යේසුස් වහන්සේ ඔබ ගැන ගැඹුරු අනුකම්පාවක් දක්වන සේක. රාත්‍රීයාමයේදී උන්වහන්සේ ඔබගේ ක්ලාන්තභාවය සහ ඔබගේ නින්ද නොයෑම දකින සේක. හෙදිය සහ මිතුරා ඉතා වෙහෙසකර නිසා ඔබව හැරගිය විට උන්වහන්සේ තවමත් ඔබ සමඟ සිටිමින් ඔබගේ රෝගයේ දී ඔබගේ ඇඳ පිළියෙල කරන සේක. මගේ දෙවියන් වහන්සේ ස්වර්ගයේ තේජස සමඟ සහ ලෝකයේ කටයුතු කළමනාකරණය කිරීම සමඟ ඉතා කාර්යබහුල බැවින් උන්වහන්සේ මාව අමතකර ඇත යනුවෙන් ඔබ නොපැවසිය යුතුය. **“පියෙක් තම දරුවන්ට අනුකම්පා කරන්නාක් මෙන් ස්වාමීන්වහන්සේ තමන් කෙරෙහි භය ඇත්තන්ට අනුකම්පා කරන සේක. ”** (ගීතාවලිය 103:13) එය මත රදා පවතින ශ්‍රේෂ්ඨ දෙවියන් වහන්සේ තමන්ගේම දරුවන්ගේ කෙනෙකුව හෙළා නොදැකීමට තරම් බලවත්ය. උන්වහන්සේ ඔබේ කඳුළු දකින අතර ඔබගේ කෙදිරිගෑම අසයි. මක්නිසාද උන්වහන්සේ තම සෙනඟ අතරේ ඉතා කුඩා අය සමඟ වාසය කරන සේක. **“ඔවුන්ගේ සියලුම දුක්වලදී උන්වහන්සේ දුක් වූ සේක උන්වහන්සේගේ අභිමුඛය වන දූත තෙවේ ඔවුන් ගැලෙව්වේය. උන්වහන්සේ තමන්ගේ ප්‍රේමයෙනුත් දයාවෙනුත් ඔවුන් වුදා පුරාණයේ සියලුම දවස්වල ඔවුන් උසුලාගෙන ගිය සේක.”** (යොසායා 63:9) “දෙවියන් වහන්සේගේ උදාරත්වය” යන දේශනාවෙන් සාරාංශ කරන ලදි.

“දෙවියන් වහන්සේ අප කෙරෙහි ඇති ප්‍රේමය අපි දැන විශ්වාස කරගෙන සිටිමුව. දෙවියන් වහන්සේ ප්‍රේමයය... ” (1 යොහාන් 4:16)

අපගේ ශ්‍රේෂ්ඨ වූ දෙවියන් වහන්සේ තුළ ජීවත්වීම

"නිශ්චලවව්, *මා දෙවියන් වහන්සේ බව දැනගනීව්, ජාතීන් අතරේ උසස් වන්නෙව්. පොළොවෙහි උසස් වන්නෙව්."* (ගීතාවලිය 46:10)

අපට කළ හැකි වැදගත්ම හා ප්‍රයෝජනවත්ම දේවලින් එකක් නම්, නිශ්චලව සිටීමට සහ දෙවියන් වහන්සේ, දෙවියන් වහන්සේ බව දැන ගැනීමට කාලය ගත කිරීමයි. දැන් පවා මොහොතක් ඒ සඳහා ගතකරන්න. සත්‍යතාවය ඔබගේ හදවතට, මනසට සහ ආත්මයට ඇතුල්වීමට ඉඩදෙන්න. දෙවියන් වහන්සේ ජීවමානව සිටින අතර උන්වහන්සේ තමන්වහන්සේ ගැන එළිදරව් කරන සෑම දෙයක්ම සත්‍ය වේ. උන්වහන්සේ පියාණන් වහන්සේ වන දෙවියන් වහන්සේය. පුත්‍රයාණන් වහන්සේ වන දෙවියන් වහන්සේය. ශුද්ධාත්මයාණන් වන දෙවියන් වහන්සේය. උන්වහන්සේ මැවුම්කරුවාණන් සහ ලෝකය පෝෂණය කරන තැනැත්තා වහන්සේය. උන්වහන්සේ සදාකාලයේ සිට සදාකාලයටම සිටින සේක. උන්වහන්සේ තම සදාකාලික සැලැස්මට අනුව (කැමැත්තට අනුව) උන්වහන්සේගේ සදාකාලික අරමුණු ක්‍රියාත්මක කරන සේක. උන්වහන්සේ අද්විතීය ස්වෛරී, සර්වබලධාරී, සර්වඥ සහ සර්ව සම්පූර්ණ දෙවියන් වහන්සේය. උන්වහන්සේ ඉතා ශුද්ධ, සම්පූර්ණ සැබෑ වූ, ධර්මිෂ්ඨ , විශ්වාසවන්ත, වෙනස් නොවන දෙවියන් වහන්සේ වන සේක. උන්වහන්සේ ප්‍රේමයෙන්, කරුණාවෙන්, අනුකම්පාවෙන්, දයාවෙන් සහ සමාවදීමෙන් පිරී සිටින සේක. උන්වහන්සේ සුව කරන්නා වූ තැනැත්තා වහන්සේය. ගැලවීම ලබාදෙන්නා වූ, ආරක්ෂාව සපයා දෙන්නා වූ, අවශ්‍යතාවය සුපරාලන්නා වූ තැනැන්වහන්සේ වන සේක. උන්වහන්සේගේ ගුණාංග සහ ක්‍රියාවන්වල ලැයිස්තුව දිගින් දිගටම පවතියි. දෙවියන් වහන්සේ මොනතරම් අනර්ඝ දෙවියන් වහන්සේද ... ?

අපගේ දෙවියන් වහන්සේ කවුද ... ? සහ උන්වහන්සේට කළ හැකි දේ පිළිබඳව, එවැනි තේජාන්විත සත්‍යතාවයන් පිළිබඳව ආලෝකයෙන් අප ජීවත්විය යුතු ආකාරය ගැන මොහොතක් බලන්න. ඒ සඳහා ප්‍රවේශවීම් කිහිපයක්ම මෙසේය.

(1) දෙවියන් වහන්සේට සහ උන්වහන්සේගේ කැමැත්තට සම්පූර්ණයෙන්ම යටත්වෙන්න.

දෙවියන් වහ්නසේගේ සදාකාලික සැලැස්මේ කොටසක් ලෙස සහ උන්වහන්සේගේ සදාකාල මහිමය සඳහා අපව උන්වහන්සේ විසින් අරමුණක් ඇතිව නිර්මාණය කර ඇත. අපගේ ජීවිත ඉතා වැදගත් වන අතර අපි උන්වහන්සේගේ කැමැත්තට යටත්වන විට අපගේ ජීවිත දැන් සහ සදාකාලයටම වැදගත්වීමට සලස්වන බවට අපට උන්වහන්සේව විශ්වාස කළ හැකිය. "තවද දෙවියන් වහන්සේට ප්‍රේමකරන්නන්ට, එනම් උන්වහන්සේගේ අභිප්‍රාය ලෙස කැඳවනු ලැබූවන්ට සියලුදේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුව." (රෝම 8:28)

(2 දෙවියන් වහන්සේට ප්‍රේම කරමින් කීකරුවෙන්න

දෙවියන් වහන්සේ ප්‍රේමයයි. අපි උන්වහන්සේට ප්‍රේමකරන්නේ උන්වහන්සේ ප්‍රථමයෙන් අපට ප්‍රේම කළ නිසාය. (1 යොහාන් 4:8, 19) උන්වහන්සේ අපගේ සියලු ප්‍රේමයට සුදුසු වන අතර අපගේ මුළු හෘදයෙන්, මුළු ආත්මයෙන්, මුළු බුද්ධියෙන්, මුළු ශක්තියෙන් උන්වහන්සේට ප්‍රේම කළ යුතුය. (මාර්ක් 12:30) අපගේ ප්‍රේමය දෙවියන් වහන්සේට පෙන්වන එක් ක්‍රමයක් නම්, උන්වහන්සේගේ ආඥා පිළිපැදීමයි. (1 යොහාන් 5:3)

(3) දෙවියන්වහන්සේව, උන්වහන්සේගේ වචනය සහ උන්වහන්සේගේ පොරොන්දු සම්පූර්ණයෙන්ම සහ මුළුමනින්ම විශ්වාස කරන්න.

බයිබලයේ සඳහන් පුද්ගලයින්ගේ ශ්‍රේෂ්ඨ ඇදහිල්ල ගැන ඔබ සිතන විට සැබවින්ම ඔවුන් දෙවියන් වහන්සේ කෙරෙහි විශාල දැක්මක් ඇතිව උන්වහන්සේගේ වචනය විශ්වාස කළෝය. උදාහරණ වශයෙන්, ආබ්‍රහම්ට ඔහුගේ තත්ත්වය ජයගත නොහැකි යැයි පෙණුනත් දෙවියන් වහ්නසේගේ පොරොන්දුව කෙරෙහි විශ්වාස කරමින් නොසැලී සිටියේය. ***"නුඹේ වංශය වෙසේ වන්නේය කියා තිබෙන ලෙස ආබ්‍රහම් බොහෝ ජාතීන්ගේ පියා වන පිණිස බලාපොරොත්තුවීමට ඉඩනැති තැන බලාපොරොත්තුවෙන් විශ්වාස කළේය. ඩහු (අවුරුදු සියයක් පමණ වයස්ගතව සිටියදී) ඇදහිල්ලෙන් දුර්වල නොවී තමාගේම ශරීරය මළ බව හා සාරා කුසය ම ළ බවත් සිතා ඇදහිලි නැතිකම කරුණාකොටගෙන වංචල නොවී එසේය, දෙවියන් වහන්සේගේ පොරොන්දුව දෙස බලා ඇදහිල්ලෙන් බලවත්ව දෙවියන් වහන්සේට ගෞරව කරමින් පොරොන්දු වූ දේ ඉෂ්ඨ කරන්ට උන්වහන්සේට පුළුවන කියා නිසැකව විශ්වාස කළේය."*** (රෝම 4 : 18-21) අපගේ විශ්වාසය දෙවියන් වහන්සේ තුළ තබන විට දෙවියන් වහන්සේ ඒ සෑම අවස්ථාවකදීම උන්වහන්සේගේ විශ්වාසවන්තභාවය තහවුරු කරන සේක. අපට අපගේ සියලු අවශ්‍යතා උන්වහන්සේට භාරදිය හැකි අතර අපග් සියලු කරදර උන්වහන්සේ මත තැබිය හැකිය. (මතවේ 6:31-33, 1 ප්‍රේත්‍රුස් 5:7)

(4) මහත් ඇදහිල්ලෙන්, යාච්ඤා කරන්න.

අපගේ දෙවියන් වහන්සේ යාච්ඤා අසන සහ යාච්ඤාවලට පිළිතුරු ලබාදෙන දෙවියන් වහන්සේ වන සේක් නම් (උන්වහන්සේ එලෙසින් ක්‍රියා කරන සේක.) අපගේ දෙවියන් වහන්සේ බලයෙන් හා හැකියාවෙන් අසීමිත සේක් නම් (උන්වහන්සේ එලෙස සිටින සේක) එවිට අපි යාච්ඤාවෙන් විශ්මිත පිළිතුරු අපේක්ෂා කළ යුතුය. අපගේ දෙවියන් වහන්සේ කොයිතරම් ශ්‍රේෂ්ඨ හා බලවත් ද යන්න නිසා අබ ඇටයක් ප්‍රමාණයක් ඇදහිල්ලකට කඳු පහකළ හැකිය. "උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැකකම නම් අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය. අප යම් දෙයක් ඉල්ලන කළ උන්වහන්සේ අසන බව අපි දනිමු නම් අප උන්වහන්සේගෙන් ඉල්ලූ දේ අපට ලැබෙන බව දනිමුව" (1 යොහාන් 5:14-15) "ඉතින් අප තුළ ක්‍රියාකාරන්නා වූ බලයේ හැටියට අපි ඉල්ලන නොහොත් සිතන හැමදේම වඩා ඉතා අධික ලෙස කරන්ට බලය ඇත්තා වූ තැනැන්වහන්සේටම සියලු පරම්පරාවන් දක්වා සභාවෙහි ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ සාදාකාලටයම ගෞරව වේවා! ආමේන් ..." (එපීස 3:20-21)

(5) දෙවියන් වහන්සේගේ ජීවනයෙන් පිරී සිටින්න

දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ ආත්මයෙන් ඉතා ත්‍යාගශීලීව, උන්වහන්සේගේ ප්‍රේමයෙන් අපව පොහොසත් කරන සේක. උන්වහන්සේගේ ප්‍රීතියෙන් හා සාමයෙන් අපව පුරවන සේක. උන්වහන්සේ සෑම අධ්‍යාත්මික ආශිර්වාදයකින්ම අපට ආශිර්වාද කරන සේක. උන්වහන්සේගේ බලය අප තුළ බලවත් ලෙස ක්‍රියා කරයි. එබැවින් සාමාන්‍ය ආත්මික ජීවිතයක් ගත කිරීමෙන් සෑහීමට පත්නොවන්න. නමුත් උන්වහන්සේගේ පූර්ණත්වයෙන් ඔබව ඉතිරී යන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටින්න. " මේ නිසා ස්වර්ගයෙහිද, පොළොවෙහිද, ඒ ඒ ගෝත්‍රයට නම් දෙන්නා වූ පියාණන් වහන්සේට මම මාගේ දණ නමා උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ කරුණුකොටනෙ නුඹලාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹලා බලයෙන් ශක්තිමත් වන පිණිසත් ඇදහිල්ල කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේ නුඹලාගේ සිත් තුළ වාසය කරන පිණිසත් නුඹලා ප්‍රේමයෙහි මුල් ඇඳ පිහිටා සිට, දෙවියන් වහන්සේගේ මුලු පූර්ණකමට පූර්ණ වන පිණිස සියලු ශුද්ධවන්තයන් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන, එහි පළල, දිග, උස, ගැඹුර කිමෙක් ද කියා තේරුම්ගන්ට නුඹලාට පුළුවන් වන පිණිසත් උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤා කරමි." (එපීස 3:14-19)

"දෙවියන් වහන්ස...., වුවා දිය දොළුවලට ඉතා ආශාවන්නාක් මෙන් මාගේ ආත්මය ඩබ කෙරෙහි ඉතා ආශා ඇත්තේය. දෙවියන් වහන්සේ කෙරෙහි එනම් ජීවමාන දෙවියන් වහන්සේ කෙරෙහි මාගේ ආත්මය පිපාසාවේ. වම කවදා ඇවිත් දෙවියන් වහන්සේ ඉදිරියෙහි පෙනෙවිද .... ? " (ගීතාවලිය 42:1-2)

"ධර්මිෂ්ඨකම සාපිපාසා අත්තෝ ආශිර්වාද ලද්දෝය. වක්නිසාද ඔවුහු තෘප්තියට පැවිණෙන්නෝය." (මතවේ 5:6)

(6) බලාපොරොත්තුවෙන් පූර්ණ වෙන්න.

අපගේ තත්ත්වය කොයිතරම් කළ නොහැකි දෙයක් ලෙස පෙණුනත්, අපට සැමවිටම බලාපොරොත්තුවක් තබාගත හැකිය. අතිමහත් සතුරෙකුට මුහුණ දෙන විට පවා යොහෝෂාපාට් රජතුමා දෙවියන් වහන්සේ පිළිබඳව තිබූ ඔහුගේ විශාල දැක්ම සහ දෙවියන් වහන්සේ කෙරෙහි ඔහුගේ විශ්වාසය (බලාපොරොත්තුව) පිළිබඳව සලකා බලන්න. "අපේ පියවරුන්ගේ දෙවියන් වහන්ස, ඔබ ස්වර්ගයෙහි දෙවියන් වහන්සේ නොවන සේක්ද .... ? ජාතීන්ගේ සියලු රාජ්‍යවල් කෙරෙහි ආණ්ඩු කරන්නෙත් ඔබ නොවේද ... ? ඔබගේ අතේ බලය හා පරාක්‍රමය තිබේ. ඔබට විරුද්ධව සිටින්ට පුළුවන් කෙනෙකුත් නැති අපේ දෙවියන් වහන්ස ....." (2 ලේකම් 20:6) "අපේ දෙවියන් වහන්ස .... ඔබ ඔවුන් විනිශ්චය නොකරන සේකද ... ? මක්නිසාද අපට විරුද්ධව එන මේ මහත් සමූහයා ඉදිරියෙහි සිටින්ට අපට ශක්තිය නැත. අපි මක්කරමුද කියාත් නොදනිමුව. නමුත් අපේ ඇස් ඔබ දෙසම යොමුකර තිබේ යයි කීවේය." (2 ලේකම් 20:12) දෙවියන් වහන්සේ එවැනි නිහතමානීකමකට සහ ඇදහිල්ලට ගරු කළ අතර ඔවුන් වෙනුවෙන් මැදහත්වී සටනට සහභාගි වූ සේක. එලෙසම අපට උන්වහන්සේ ඉදිරියෙහි නිශ්චලව බලාසිටිය හැකිය. මක්නිසාද අපේ බලාපොරොත්තුව සහ අපේක්ෂාව උන්වහන්සේ කෙරෙහිය. (ගීතාවලිය 62:5)

(7) ශුද්ධව සිටින්න

දෙවියන් වහන්සේ ශුද්ධව සිටින ආකාරයටම ශුද්ධව සිටීමට උන්වහන්සේ අපව කැඳවන සේක. (1 ප්‍රේත්‍රුස් 1:15-16) අපි දෙවියන් වහන්සේගෙන් උපත ලැබුවොත් අපි පව් නොකරන්නෙමු. මක්නිසාද

4 පිටුවට

3පිටුවෙන්

අපගේ ශ්‍රේෂ්ඨ වූ දෙවියන්...

දෙවියන් වහන්සේගේ බීජය අප තුළ පවතින සේක. (1 යොහාන් 3:9) දෙවියන් වහන්සේට ගෞරව කරමින් දේවභය ඇතිව දෙවියන් වහන්සේට ප්‍රේම කරන්න. ඕනෑම පාපයක් අතහැර උන්වහන්සේට ඔබව සම්පූර්ණයෙන්ම විශුද්ධ කිරීමට ඉඩදෙන්න. **"සමාදානයේ දෙවියන් වහන්සේම නුඹලා සහමුලින්ම පවිත්‍රකරන සේක්වා. නුඹලාගේ මුළු ආත්මයත්, ප්‍රාණයත්, ශරීරයත් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ඊවේදී නිදොස්ව තිබෙන ලෙස ආරක්ෂා කරනු ලැබේවා. නුඹලා කැඳවන තැනැත්වහන්සේ, විශ්වාසව සිටින සේක. උන්වහන්සේ එක ඉෂ්ඨද කරන සේක."** (1 තෙසලෝනික 5:23-24)

ඇත්ත වශයෙන්ම අපගේ දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය සහ අපගේ ජීවිතවලට අදාළ වන තවත් බොහෝ දේ ලිවිය හැකිය. නමුත් මෙම කුඩා විශ්ලේෂණය සහ මෙම කලාපයේ අනෙකුත් ලිපි වලින් පවා දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයේ නිහඬව සිටීමට නිතිපතා අවස්ථාවක් ලබා ගැනීමට අපව දිරිමත් කිරීමට ප්‍රමාණවත් වනු ඇතැයි අපේක්ෂා කරන්නෙමු. එවිට එයින් අදහස් කරන සියල්ලෙන් උන්වහන්සේ දෙවියන් වහන්සේ බව අපට වඩ වඩා පහදා දිය හැකිය.

දෙවියන් වහන්සේගේ පොරොන්දුවල අරමුණ

"සදාකාලික ස්වභාවයේ දෙවියන් වහන්ස, මම ඔබ ඉදිරියට පැමිණ හිස නමමි. වෙහෙසකර කාර්යාවලදි ඔබවහන්සේගේ වචනය මාගේ පර්වතය සහ අත්තිවාරමයි. මම ඔබ කෙරෙහි විශ්වාසය තබා මාගේ දෛනික කාර්යයන් සඳහා ඔබගේ කරුණාව දෙස බලා සිටිමි. ඔබගේ පොරොන්දු සියලු පව්පරාවලදී සැබෑවී ඇති අතර ඔබගේ වචනයේ දිගහැරෙන සියලු පොරොන්දු වන මම මාගේ ජීවිතය රඳවාගනිමි. ඔබගේ පොරොන්දු උයනේ මල් මෙන් ඔබගේ පැමිණීමේ සුවඳින් මගේ ජීවිතය පුරවා ඇත. ආමේන් ! "

අපි අපගෙන්ම මෙසේ අසාගත යුතුය. දෙවියන් වහන්සේගේ පොරොන්දුවල අරමුණ කුමක්ද ..? මෙම පොරොන්දු දෙවියන් වහන්සේ සමඟ මගේ සම්බන්ධතාවයට සහ දෙවියන් වහන්සේ සමඟ මගේ ගමනට දිනපතා බලපාන්නේ කෙසේද ? දෙවියන් වහන්සේගේ පොරොන්දු වලින් දෙවියන් වහන්සේ ගැන අප දැනගත යුතු සියල්ල සහ වඩාත් වැදගත් ලෙස දෙවියන් වහන්සේ අප තුළ කිරීමට කැමති සියල්ල හෙළි කරයි.

ඕනෑම පොරොන්දුවක් ඇගයීමේ පළමුවන පියවර වන්නේ එම පොරොන්දුව පිටුපස සිටින්නේ කවුද යන්න සොයා බැලීමයි. පොරොන්දුවක් යනු පොරොන්දුව ඉටුකරන තැනැත්තා තරම්ම යහපත් දෙයකි. ඔහුට තම පොරොන්දුව ඉටු කළ හැකිද ? මෙම පොරොන්දුව එය ලබාදෙන තැනැත්තා ගැන පවසන්නේ කුමක්ද ? ඕනෑම කෙනෙකුට ඕනෑම දෙයක් පොරොන්දු විය හැකිය. නමුත් එකම නීත්‍යානුකූල පොරොන්දුවක් ලැබෙන්නේ එය ඉටුකිරීමට හැකි පුද්ගලයාගෙනි. දෙවියන් වහන්සේ අපට දුන් පොරොන්දු ඉටුකිරීමට හැකියාවෙන් පමණක් නොව උන්වහන්සේ එය ඉටුකිරීමට කැමැත්තෙන්ද සිටින සේක. ආගම් තුළ සාමාන්‍යයෙන් බොහෝ දේ පොරොන්දු වේ. නමුත් කාලය ඔප්පු කර ඇත්තේ එයට එහි පුරසාරම් දෙඩීමට අනුව කටයුතු කළ නොහැකි බවයි. ඔබ කැමති ආගමක් තෝරාගෙන එහි පොරොන්දු පරීක්ෂා කර බලන්න. එවිට ඒවා ඉටුකළ නොහැකි බව ඔබට වැටහෙනු ඇත. ක්‍රිස්තුස් වහන්සේ දෙන සෑම පොරොන්දුවක්ම උන්වහන්සේ සම්පූර්ණයෙන්ම ඉටුකරන සේක. දෙවියන් වහන්සේගේ පොරොන්දු මෙතරම් ප්‍රීතිමත් කරන්නේ එයයි. එසේම ක්‍රිස්තුස් වහන්සේ සමඟ මාගේ ගමනේදී එය අත්‍යාවශ්‍යවේ.

යාකොබ් තම දර්ශනයේ දුටු ඉනිමඟ ඔහු සිටි තැනින් දෙවියන් වහන්සේ සිටි ස්වර්ගයට ඉහළට ගිය ආකාරයටම දෙවියන් වහන්සේගේ පොරොන්දු අපව දෙවියන් වහන්සේගේ අභිමුඛත්වට තව තවත් සමීපකරයි. යාකොබ් සොයාගත්තේ මෙයයි. "යාකොබ් තමාගේ නින්දෙන් පිබිද ඒකාන්තයෙන්ම ස්වාමීන් වහන්සේ මෙතැන සිටින සේක. මම ඒ බව නොදත්තෙමියි කියා භයවී, මේක කොපමණ භයානක ස්ථානයක්ද ඒකාන්තයෙන්ම මේක දෙවියන් වහන්සේගේ ගෘහයය. මේක ස්වර්ග යේ දොරටුවයයි කීවේය. (උත්පත්ති 28: 16-17)

දෙවියන් වහන්සේගේ පොරොන්දු උන්වහන්සේගේ ස්වභාවයේ අංශ හෙළිකරයි.

උත්පත්ති සිට එළිදරව් දක්වා දෙවියන් වහන්සේගේ පොරොන්දු දෙස බලනවිට ඒ සෑම එකක් පිටුපසම දිව්‍යමය අරමුණක් තිබෙන බව අපට පෙනෙන්නේය. දෙවියන් වහ්නසේගේ පොරොන්දු යනු වෙනස්වෙන සුළු හෝ තම සෙනගට තමන්වහන්සේ ගැන හොඳ හැඟීමක් ඇතිකර ගැනීමට අත්තනෝමතික දේවල් පොරොන්දුවීම නොවේ. දෙවියන් වහන්සේගේ පොරොන්දු සැලසුම් සහගතව තිබේ. අපි ඒවා පිළිගන්නා විට අපගේ කිතුණු ජීවිතය අපි කිසිදා නොදැන සිටි අධ්‍යාත්මික බලයේ මට්ටම් කරා නැඟීමට පටන් ගනියි. දෙවියන් වහන්සේගේ පොරොන්දු දෙස සමීපව බැලීමෙන් හෙළිවන්නේ ඒවා ද්විත්ව ස්වභාවයකින් යුක්ත බවයි. පළමුව දෙවියන් වහන්සේගේ සෑම පොරොන්දුවක්ම දෙවියන් වහන්සේගේ ස්වභාවයේ සහ චරිතයේ අංග හෙළිදරව් කරනු ලබයි. උන්වහන්සේ තම සෙනඟ උන්වහන්සේව දැනගන්නවාට ආශා කරන සේක. බොහෝ අය දෙවියන් වහන්සේ ගැන දැන සිටිති. ගැටළුව වන්නේ දෙවියන් වහන්සේ කැමති ආකාරයට උන්වහන්සේව දැන ගැනීමට පැමිණෙන්නේ ස්වල්ප දෙනෙක්වීමයි. දෙවියන් වහන්සේ සිටින බව දැන ගැනීම හෝ මම කැමති කෙනෙකු ඉහළින් සිටින බව විශ්වාස කිරීම එක දෙයකි. දෙවියන් වහන්සේව උන්වහන්සේ කැමති ගැඹුරු මට්ටමෙන් දැන ගැනීම ඊට හාත්පසින්ම වෙනස් දෙයකි. දෙවියන් වහන්සේගේ පොරොන්දු නමස්කාර කරන හදවතකට විවෘත කරයි. එය උන්වහන්සේ තමන් වහන්සේ ගැනම හෙළිදරව් කිරීම්වල කේන්ද්‍රයයි. සෑම ඇදහිලිවන්තයෙකුගේම ආශාව සෑම දිවසකදීම ඇතුළාන්තයෙන් උන්වහන්සේව වඩ වඩා දැන ගැනීමයි.

මා අදහස් කරන දේ පහදා දීමට උදාහරණ කිහිපයක් ඉදිරිපත් කිරීමට මට ඉඩදෙන්න. 1 ප්‍රේතුස් 5:7 වන පදයේ පොරොන්දුව ගන්න. **"උන්වහන්සේ නුඹලා ගැන සලකන බැවින් නුඹලාගේ හැම කරදර උන්වහන්සේ පිට තබාපල්ලා."** මෙම පොරොන්දුව දෙවියන් වහන්සේ ගැන අපට පවසන්නේ කුමක්ද ? මෙම පොරොන්දුවෙන් දෙවියන් වහන්සේ තමන්වහන්සේ ගැන අපට හෙළිදරව් කිරීමට කැමති කුමක්ද ? මෙම පොරොන්දුවෙන් අපට අනාවරණය කරන්නේ උන්වහන්සේ දවසින් දවස අපට බරක් වෙන දේවල් ගැන ගැඹුරින් සැලකිලිමත්වන දෙවියන් වහන්සේ බවයි. දෙවියන් වහන්සේ අපගේ දෛනික ජීවිතයේ සංකීර්ණතා ගැන උන්නදුවන සේක. අපගේ අනතුරු සහිත හෝ බලාපොරොත්තු රහිත හදිස්සි අවස්ථාවලදී පමණක් නොව ඇත්ත වශයෙන්ම අපගේ ජීවිතවල සෑම අවස්ථාවක් ගැනම සැලකිලිමත් වන සේක. එම නිසා මෙම පොරොන්දුවෙන් අපට පෙන්වන්නේ දෙවියන් වහන්සේ අප සමඟ ඉතා සමීපව සිටීමට කැමැත්තෙන් සිටින දෙවියන් වහන්සේ බවත්, උන්වහන්සේ අපගේ එදිනෙදා කරදර බෙදාගන්නා බවත් වන සේක. උන්වහන්සේ සමීපව අපව හඳුනාගැනීමට කැමැත්තෙන් සිටිනවා පමණක් නොව උන්වහන්සේගේ අභිමුඛත්වය තුළ සැනසීම දැනෙන්නට සැලැස්වීමටත් බලා සිටින බැවින් මුළු හදවතින්ම එම කැමැත්ත සොයමු. මෙය නිසැකවම කිතුණුවන්ට උද්යෝගයෙන් වැළඳගැනීමට ඇති පොරොන්දුවකි.

(ඒ.ඩබ්. ටෝසර් විසිනි) (1897-1963)

තවත් උදාහරණයක් ගැන සැලකිල්ල දක්වන්න. **"අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක."** (1 යොහාන් 1:9) මෙහි දෙවියන් වහන්සේ තවත් සරල පොරොන්දුවක් ලබාදෙයි. එයින් දෙවියන් වහ්නසේ ගැන අපට අනාවරණය කරන්නේ කුමක්ද ? දෙවියන් වහන්සේ අපට මෙම පදයෙන් පැවසීමට උත්සාහ කරන්නේ කුමක්ද ? මෙය අපට දෙවියන් වහන්සේගෙන් ලැබිය හැකි ඉතාම අනර්ඝ වූ අනාවරණය විය හැකිය. දෙවියන් වහන්සේ සමාවදෙන දෙවියන් වහන්සේය. අපගේ පාපවලට සමාවදීමට උන්වහන්සේ විශ්වාසවන්තව හා ධර්මිෂ්ඨව සිටින සේක. උන්වහන්සේ අපට සමාව ලබාදෙන්නේ උන්වහන්සේට අප කෙරෙහි ඇතිවය හැකි හාස්‍යජනක ස්වභාවයක් නිසා හෝ හෙට වෙනස්විය හැකි තාවකාලික මනසකින් යුතුව නොවේ. ඒ වෙනුවට දෙවියන් වහන්සේගේ සමාවදීම උන්වහන්සේගේ නොවෙනස්වන චරිතය සහ ස්වභාවය මත පදනම්වී තිබේ. **" මක්නිසාද ස්වාමීන් වහන්සේ වන මම වෙනස් නොවෙමි. එබැවින් යාකොබ්ගේ පුත්‍රයෝ වූ නුඹලා විනාශ නොවී සිටින්නහුය."** (මලාකි 3:6) දෙවියන් වහන්සේ අපට අනාවරණය කිරීමට කැමැත්තෙන් සිටින්නේ උන්වහන්සේගේ සමාවදීමේ හැකියාව අපට පවකිරීමට ඇති හැකියාවට වඩා විශාල බවත් ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුලින් මෙම සමාවදීමේ හැකියාව සෑම කෙනෙකුටම සමාන ප්‍රවේශයක් ඇති බවත්ය.

තවත් උදාහරණයක් දෙස බලමු. **" නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමීන්වහන්සේ කෙරෙහි විශ්වාස කරපන්න. නුඹේ සියලු මාර්ගවලදී උන්වහන්සේ සලකාපන්න. එවිට උන්වහන්සේ නුඹේ මාවත් සමතලා කරනවා ඇත."** (හිතෝපදේශ 3:5-6) දෙවියන් වහන්සේගේ මෙම අනර්ඝ පොරොන්දුව තුළ රැකවරණය ලබානැත්තේ කවුද .. ? මෙම පොරොන්දුව තුලින් දෙවියන් වහන්සේ අපට අනාවරණය කිරීමට උත්සාහ කරන්නේ උන්වහන්සේ අපගේ ජීවන මාර්ගය ගැන පුද්ගලිකව උනන්දුවක් දක්වන බවයි. උන්වහන්සේ අපගේ මාර්ගය මෙහෙයවීමට කැමති වන අතර උන්වහන්සේ අපගේ මාර්ගය මෙහෙයවන විට නිවැරදි මාර්ගයේ ගමන් කරන බවට අපට සහතික විය හැකිය. දෙවියන් වහන්සේ මගේ ජීවිතයේ සෑම දිනකම මා ගන්නා වූ සෑම පියවරක් ගැනම පුද්ගලිකවම උනන්දු වන අතර මෙම පොරොන්දුව තුලින් පැහැදිලි කරන්නේ මගේ ජීවිතයේ සමස්ත දිශාව පිළිබඳවම

5පිටුවට

4 පිටුවෙන්

දෙවියන් වහන්සේගේ පොරොන්දුව...

මට උන්වහන්සේව විශ්වාස කළ හැකි බවයි. උන්වහන්සේ මාව පරාජයට පත්වීමට ඉඩහරින්නේ හෝ මාව වැරදි දිශාවට රැගෙන යන්නේ නැත.

පොරොන්දු තවත් බොහෝමයක් පවතින අතර ඒ සෑම පොරොන්දුවකින්ම දෙවියන් වහන්සේගේ චරිතය සහ ස්වභාවය පිළිබඳ යමක් හෙළිදරව් කරනු ලබයි. අපි ඒවා දැන ගැනීම උන්වහන්සේට අවශ්‍ය වන සේක. මෙම පොරොන්දු ලුහුබැඳයාම යනු අපගේ ස්වභාවය තුළ දෙවියන් වහන්සේගේ ස්වභාවයේ ලක්ෂණ සොයා ගැනීමට හැකිවීමයි.

දෙවියන් වහන්සේගේ පොරොන්දු වලින් මා නැහැවී සිටින විට මම උන්වහන්සේගේ හදවත සහ ආශාව තේරුම් ගනිමි. එම පොරොන්දු සියලු මනුෂ්‍යයන් කෙරෙහි පමණක් නොව විශේෂයෙන් මා කෙරෙහි යොමුකර තිබේ. දෙවියන් වහන්සේගේ වචනයේඇතිඋන්වහන්සේගේපොරොන්දුඅධ්‍යයනය කිරීමෙන් මට ලැබෙන්නේ ශාස්ත්‍රීය දැනුමක් පමණක් නොවේ. දෙවියන් වහන්සේ උන්වහන්සේ ගැන මම දැනගත යුතු දේ ශුද්ධාත්මයාණන්ගේ බලය තුළින් මෙම පොරොන්දු හරහා මට හෙළිදරව් කරන සේක. දෙවියන් වහන්සේ කැමති ආකාරයට උන්වහන්සේව දැන ගැනීමට පැමිණීම කොපමණ ප්‍රීතියක්ද ? ලෝකය හෝ ආගම වූවත් මා වෙනුවෙන් දෙවියන් වහන්සේව අනාවරණය කරනවාට මම කැමති නැත. ශුද්ධාත්මයාණන් වහන්සේ මට දී ඇති අති ශ්‍රේෂ්ඨ හා වටිනා පොරොන්දු හරහා දෙවියන් වහන්සේව මට හෙළිදරව් කරනවාට මම කැමැත්තෙමි.

දෙවියන් වහන්සේගේ පොරොන්දු තුළින් උන්වහන්සේගේ අපේක්ෂාවන් අපට හෙළිදරව් කරනු ලබයි.

දෙවියන් වහන්සේගෙන් ලැබුණු මෙම පොරොන්දුවල දෙවන ලක්ෂණය නම් ඒවායින් උන්වහන්සේ අප කෙරෙහි ඇති අපේක්ෂාව අනාවරණය කරනු ලබයි. දෙවියන් වහන්සේ අපෙන් බලාපොරොත්තු වන දේ අපි අනුමාන කළ යුතු නැත. උන්වහන්සේගේ පොරොන්දු තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ ජීවිත සඳහා දෙවියන් වහන්සේගේ ඉහළ අපේක්ෂාව අපට හෙළි කිරීමට පටන් ගන්නා සේක. දෙවියන් වහන්සේගේ චරිතය සහ ස්වභාවය අනාවරණය කිරීමට භාවිතා කර ඇති පොරොන්දු දෙස නැවත බලමු. මෙම පොරොන්දු තුළින් දෙවියන් වහන්සේ අපේක්ෂා කරන්නේ කුමක්දැයි අපට දැකගත හැකිය.

ප්‍රථමයෙන් මෙම උදාහරණය බලන්න. **“උන්වහන්සේ නුඹලා ගැන සලකන බැවින් නුඹලාගේ හැම කරදර උන්වහන්සේ පිට තබාපල්ලා.”** (1 පේත්‍රුස් 5:7) දෙවියන් වහන්සේ මා කෙරෙහි ඇති අපේක්ෂාව ගැන මෙම පොරොන්දුවෙන් මට හෙළිදරව් කරන්නේ කුමක්ද ? මෙම පොරොන්දු අපට පෙන්වන්නේ මා පිළිබඳ සියලු සැලකිල්ල උන්වහන්සේ පිට තැබීම උන්වහන්සේ සම්පූර්ණයෙන්ම අපේක්ෂා කරන බවයි. උන්වහන්සේ මගෙන් අපේක්ෂා කරන්නේ මගේ බර මා විසින්ම උසුලන්නේ නැතිව එම බර සම්පූර්ණයෙන්ම උන්වහන්සේ මතට මාරු කිරීමයි. "මම සිතින් මෘදුව යටත්ව සිටින බැවින්, මාගේ විහගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා. එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. (මතෙව් 11:29)

ජෝන් බනියන්ගේ කෘතියක් වන වන්දනා කාරයාගේ අභිවෘද්ධිය යන පොතෙහි සඳහන් කරන්නාක් මෙන් තමන්ගේම බර උසුලාගෙන කිතුණු ජීවිතය ගත කිරීමට අප අතරේ කීදෙනෙක් උත්සහ කරනවාද ..? ජෝන් බනියන්ගේ කෘතියේ සඳහන් වන වන්දනාකරුවා මෙන් ලෝකයේ කාරණා වෙනුවෙන් ලබාදෙන සෑම සැලකිල්ලකින්ම අපි බරවී සිටිමු. දෙවියන් වහන්සේ අපට පෙන්වාදෙන මෙම පොරොන්දුව මත සියලු සැලකිල්ල සහ එයට සම්බන්ධ වී තිබෙන කණස්සල්ල උන්වහන්සේ වෙත මාරු කිරීමට අපේක්ෂා කරන බව මට පෙනේනේය. බොහෝ කිතුනුවන් තම අපේක්ෂාවන් තේරුම් නොගැනීම දකින්නට ලැබීම දෙවියන් වහන්සේට කොයිතරම් වේදනා ගෙනදෙන්නක් ද? අපි අනවශ්‍ය ලෙස බර උසුලාගෙන ගොස් ඒවායේ බරට වැටෙනවා දැකීම දෙවියන් වහන්සේට මොනරතම් වේදනාවක් විය හැකිද ?

දැන් අපි 1 යොහාන් 1:9 වන පදයේ සඳහන් පොරොන්දුව දෙස නැවත බලමු. **“අපේ පාපවල් කියාදෙවු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහ්නසේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක.”** මෙහිදී දෙවියන් වහන්සේට මා කෙරෙහි ඇති අපේක්ෂාව කුමක්ද ? සරලව පවසන්නේ නම් දෙවියන් වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේ අපගේ පාප ගැන පසුතැවිලවීමයි. අපගේ අසාර්ථකත්වයන්, වැරදි අඩුපාඩු තමන්ට අවශ්‍යදේ ලෙස (කැමති වූ දේ ලෙස) හැදින්වීම සහ ඒවා උන්වහන්සේට භාරදීම උන්වහන්සේ අපේක්ෂා කරන සේක. අපට මිතුරන්ගෙන් හා ඥාතීන්ගෙන් දේවල් සැඟවීමට හැකි වුවත් දෙවියන් වහන්සේගෙන් කිසිවක් සැඟවිය නොහැකිය. ඇත්ත වශයෙන්ම මෙම පදයේ සමහර පරිවර්තනවලින් පෙනී යන්නේ අපගේ ජීවිතයේ පාපය කුමක්ද යන්න පිළිබඳව දෙවියන් වහන්සේ සමඟ එකඟ විය යුතු බවයි. මෙම පොරොන්දුව අනුව අපගේ ජීවිතයේ ගැටලු පිළිබඳව උන්වහන්සේ සමඟ විවෘතව හා අවංකව සිටීම දෙවියන් වහන්සේ අපෙන් අපේක්ෂා කරන සේක. අපි දෙවියන් වහන්සේව හොඳින් හඳුනාගන්නා තරමට අපගේ පසුතැවිලිවීම සමඟ උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීමට අපට හැකි වේ.

යම් කෙනෙක් දෙවියන් වහන්සේ අපේක්ෂා කරන මෙම කාරණය ඉටු කළ විට දෙවියන් වහන්සේ වෙනුවෙන් ජීවත්වීමට ඔහුට බලය ලබාදෙන බව සොයාගත හැකිය. අපි අපේ පාප ගැන පසුතැවිලීම පමණක් නොව සමාව හිමිකර ගැනීමේ දීප්තිය මත ගමන් කිරීම ද අපෙන් අපේක්ෂා කරන සේක. පරණ ගිවිසුමේ යෝසෙප් තම සහෝදරයන්ට පැවසූ දෙයින් මෙය පැහැදිලි කරගත හැකිය. **“නුඹලා වනාහී මට නපුර කරන්ට අදහස් කළහුය. එහෙත් බොහෝ සෙනඟ දිවි සහිතව රක්ෂා කරන පියාණන් අද තිබෙන ප්‍රකාර ඉෂ්ඨ කිරීමට දෙවියන් වහන්සේ ඒක යහපතට අදහස් කළ සේක.”** (උත්පත්ති 50:20) **“නුවුත් දෙවියන් වහන්සේ ”** යන වචන දෙක තුළ සියල්ල වෙනස් කළ බව පැහැදිලි කරන්නේය.

තුන්වන පොරොන්දුව **“නුඹේම නුවණෙහි නොපිහිටා, නුඹේ මුළු සිතින් ස්වාමීන් වහන්සේ කෙරෙහි විශ්වාස කරපන්න. නුඹේ සියලු මාර්ගයන්හිදී උන්වහන්සේ සලකාපන්න. එවිට උන්වහන්සේ නුඹේ මාවත් සවතලා කරනවා ඇත.”** (හිතෝපදේශ 3:5-6) මම දෙවියන් වහන්සේව විශ්වාස කිරීම උන්වහන්සේ අපේක්ෂා කරන සේක. එමෙන්ම දෙවියන් වහන්සේව අනුමාන කිරීම හෝ වෙනත් දෙයක් කෙරෙහි විශ්වාස කිරීම නොකළ යුතුය. අපි අපගේම න්‍යාය පත්‍රයක් සකස් කර ගැනීමට උත්සාහ නොකළ යුතුය. ඒ වෙනුවට අපගේ ජීවිතයේ සියලු ගැටළු සම්බන්ධයෙන් අපි දෙවියන් වහන්සේව විශ්වාස කළ යුතුය. දෙවියන් වහන්සේ අපෙන් එය අපේක්ෂා කරන සේක. ජීවිතයේ මගේම මාර්ගයේ ගමන් කිරීම අපේක්ෂා නොකරන සේක. මගේ අනාගතය සම්පූර්ණයෙන්ම උන්වහන්සේට භාරදී ආරම්භයේ සිට අවසානය දක්වාදැන සිටින තැනැත්වහන්සේව විශ්වාස කිරීම අපේක්ෂා කරන සේක.

අපට සම්පූරණයෙන්ම දෙවියන් වහන්සේව විශ්වාස කිරීම එතරම් අපහසු ඇයි ? සරලව කිවහොත් ශුද්ධාත්මයාණන් වහන්සේ අපට දෙවියන් වහන්සේව එළිදරව් කිරීමට කැමති ආකාරයට දෙවියන් වහන්සේව අනාවරණය කිරීමට අපි ඉඩදී නොමැත. අපි ශුද්ධාත්මයාණන්ට යටත් වන විට දෙවියන් වහන්සේගේ පොරොන්දුවල මෙම ක්‍රියාව ඉටු කිරීමට උන්වහන්සේ විශ්වාසවන්තව සිටින සේක. උන්වහන්සේ අපට පෙන්වීමට කැමති පරිදි සහ අපි උන්වහ්නසේව හඳුනා ගැනීමට සතුටු වන විට උන්වහන්සේ ප්‍රකාශ කරනු ලබන සේක.

දෙවියන් වහන්සේගේ පොරොන්දුවලට අනුකූලවීමට අපගේ ජීවිත ගෙන ඒමෙන් අපි දෙවියන් වහන්සේගේ හදවතට ගමන් කරන මාර්ගය තේරුම් ගැනීමට පටන් ගන්නෙමු. යාකොබ්ගේ ඉණිමඟ දෙවියන් වහන්සේ වෙතට නැගුණාක් මෙන් දෙවියන් වහ්නසේගේ පොරොන්දුද දෙවියන් වහන්සේගේ හදවතට යන ගමනේදී උන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වන සියල්ලවීමට අපට බලය ලබාදෙන යතුරයි. දෙවියන් වහන්සේ කවුද සහ උන්වහන්සේ අපට අනාවරණයවීමට කැමති පරිදි උන්වහන්සේ අපගේ ජීවිතයෙන් අපේක්ෂා කරන දේ අපගේ ජීවිතයේ සෑම දවසකදීම අපට අගේ කළ හැකිය.

අසීරු පීඩාවක් ගීතිකාවකට වෙනස් කිරීම

ඇතැම් සිතුවිලි හා බුද්ධිමය ගැටලුවලදී පරාජයවීමේ අවදානමක් ඇතිකර නොගෙන දෙවියන් වහන්සේගේ ආරක්ෂාව අත්දැකීමට ඕනෑම කිතුණුවෙකු ඉගෙනගත යුතු පාඩමක් හබක්කුක් පොතෙහි අඩංගුවේ. මෙම පොත කොයිතරම් පරස්පර විරෝධී ලෙස පෙණුනත් දිව්‍ය ආරක්ෂාව කලින් විසඳිය නොහැකි ගැටලුවලට විසඳුම අපට ඉදිරිපත් කරනු ලබයි.

හබක්කුක් පොතේ පණිවිඩය අසීරු බරකින් ආරම්භ වේ. **“හබක්කුක් අනාගතෝක්ති වකතෘ දුටු අසීර්ය බර”** ගීතයකින් අවසන් වේ. **“මාගේ තන්ත්‍රාණ්ඩ වාදනය කරන ප්‍රධාන වාද්‍යකරුට”** යනුවෙන් ගීතය ආරම්භ වේ. අසීරු බර සහ ගීතය අතර කේන්ද්‍රීය වූ පණිවිඩය තුළින් දෙවියන් වහන්සේ අපේ බර ගීතයට හරවන ආකාරය පෙන්වාදෙයි. හබක්කුන් අනාගතවකතෘ බරින් හා ව්‍යාකූලත්වයෙන් පෙළෙමින් සිටි අතර ඔහුගේ හදවත බරව මානසික පීඩාවන්ගෙන් හා සිතුවිලි ගැටුම් වලින් පිරී ඇත. මෙම තත්ත්වය තුළ විසඳුමක් අවශ්‍ය වේ.

(වෝල්ටර් බියුච්ලර් විසිනි) (1904-1974)

සංශෝධිත බයිබල් නව අනුවාදයේ හබක්කුක් 1 පරිච්ඡේදයේ පළමුවන පදයේ "බර" සඳහා විකල්ප පරිවර්තනයක් ලෙස **“අනාගතවකතෘ”** යන වචනය ලබා දී ඇත. මේ දෙකම සත්‍ය වේ. හබක්කුක් අනාගතවකතෘගේ පණිවිඩය බරකින් පැන නගින ලද දිව්‍ය පණිවිඩයකි. ඔහුට තර්ක කිරීම පටහැනිව තිබෙන දෙවියන් වහන්සේ කෙරෙහි ඔහුගේ

6 පිටුවට

5 පිටුවෙන්

අසීරු පීඩාවක් ගීතිකාවක...

ඇදහිල්ලට අභියෝග කරන පුද්ගලික ගැටළුවක් තිබේ. **"ස්වාමීන් වහන්ස, මම කොපමණකල් මොරගසවිද ? එහෙත් ඔබ නොඅසනසේක. බලාත්කාරය ගැන ඔබට කෑගසමි. එහෙත් ඔබ නොගළුවන සේක."** (හබක්කුක් 1:2)

"ඔබවහන්සේ අධර්මිෂ්ඨකම දකින්ට වට ඉඹහැර හිතුවක්කාර හිංසාව බලා සිටින්නේ මක්නිසාද ? නාස්තිකිරීම ද බලාත්කාරයද මා ඉදිරිපිට තිබේ. භේද තිබේ, තරඟය ද හටගනියි. එබැවින් ව්‍යවස්ථාව බෙලහීනවී, විනිශ්චය කවදාවත් නොනික්මෙයි. මක්නිසාද දුෂ්ඨයෝ ධර්මිෂ්ඨයා වටකරති. ඒනිසා විපරීත විනිශ්චයක් සැලසේ." (හබක්කුක් 1:3-4) දෙවියන් වහන්සේගේ කිසිඳු පැහැදිලි මැදිහත්වීමක් නොමැතිව දුෂ්ඨයන් අතින් ධර්මිෂ්ඨයන් දුක්විඳීම ගැටලුවේ තවත් කොටසකි.

"නපුර බලන්ට බැරි තරම් පවිත්‍ර ඇස් ඇත්තා වූ, හිංසාව බලා සිටින්ට නොහැකි වූ ඔබවහන්සේ ද්‍රෝහීන් දෙස බලාසිටින්නෙත්, දුෂ්ඨයා තමාට වඩා ධර්මිෂ්ඨ නැනැත්තා නාස්තිකරන කළ ඔබ නිශ්ශබ්දව සිටින්නෙත් ... " (හබක්කුක් 1:13) මෙය පැහැදිලිවම නපුර කෙරෙහි දෙවියන් වහන්සේගේ ඉවසීම පිළිබඳව අති ගැටලුවයි.

හබක්කුක් තමාගේ මුලු ගැටලුවම භාවිතා කර ඇති ආකාරය නම් "ඇයි ?" , "කෙසේද ?" සහ "කුමන හේතුවකටද ?" යන වචන තුනයි. මෙම වචන ඔහුගේ ගැටලුවට සහ පොතට යතුරයි. නමුත් විසඳුම නොවෙයි. ඇයි ?, කෙසේද ? සහ කුමන හේතුවකටද ? යන ප්‍රශ්නවලදී ඒවා ප්‍රශ්නය තවත් වැඩි දියුණු කරනු ලබයි.

හබක්කුක් 2 යන පරිච්ඡේදයේ දී හබක්කුක් තම බර සහ ප්‍රශ්න දෙවියන් වහන්සේ වෙතට ගෙන යන ආකාරයට අපට පෙනෙන්නේය. "මම මාගේ මුරපොළ උඩට පැමිණ, බලකොටුව උඩ සිටගෙන, උන්වහන්සේ මට කියන්නේ මොකක්ද කියාත් මාගේ පැමිණිල්ල ගැන මා විසින් මොන උත්තරයක් දිය යුතුද කියාත් දැනගන්ට බලා සිටින්නෙමි." (හබක්කුක් 2:1) මෙහිදී අපි වැදගත් කාරණයක් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. ඔහු දෙවියන් වහන්සේට කථා කරනවා පමණක් නොව ඔහුට කථා කිරීමට දෙවියන් වහන්සේටත් අවස්ථාවක් ලබාදෙන්නේය. අප අතරේ බොහෝ දෙනෙක් තමන්ගේ ප්‍රශ්න දෙවියන් වහන්සේ වෙතට ගෙන යන අතර අපට කථා කිරීමට දෙවියන් වහන්සේට කිසිඳු අවස්ථාවක් ලබාදෙන්නේ නැත.

දෙවියන් වහන්සේ කෙරෙහි බලාසිටීම නැති වූ කලාවක් බවට පත්වී ඇත. එබැවින් බොහෝ ශුද්ධවන්තයන් කිසිඳු නැංගුරුමක් නැතිව (දෙවියන් වහන්සේ කෙරෙහි බලාසිටීමක් නැතිව) දුෂ්කරතාවයන්ට මුහුණදීම පුදුමයක් නොවේ. දෙවියන් වහන්සේගේ හඬ අසනතුරු දෙවියන් වහන්සේ ඉදිරියේ බලාසිටීමට හබක්කුක් අධිෂ්ඨාන කරගෙන සිටියේය. "උන්වහන්සේ ස්වක්‍රීය ආඥාව පොළොවෙහි යවන සේක."උන්වහන්සේගේ වචන යුහුව දුවයි. (ගීතාවලිය 147:15)

හබක්කුක්ගේ දෙවියන් වහන්සේ ඔහුට කථාකර පිළිතුරු ලබා දුන් සේක. **"ස්වාමීන් වහන්සේ මට උත්තරදෙවින්, දර්ශනය කියවන්නා ඉක්මනින් කියවන්ට පුළුවන් වන පිණිස එය ලැලිවල පැහැදිලි ලෙස ලියාපන්න. මක්නිසාද දර්ශනය නියම කාලය දක්වා තව ප්‍රවාදවේ. එහෙත් එය බොරු නොවී ඉක්මනින් තීන්දුවට පැමිණෙන්නේය. එය ප්‍රවාදවෙතත් ඒ ගැන බලාසිටපන්න. මක්නිසාද එය පසු නොබැස පැමිණෙනවාම ඇත. බලව, ඔහුගේ සිත උඩඟුය, එය ඔහු තුළ අවංක නැත. ධර්මිෂ්ඨයා තමාගේ විශ්වාසකමෙන් ජීවත්වෙන්නේ යයි කී සේක."** (හබක්කුක් 2:2-4) අපි දෙවියන් වහන්සේට අවස්ථාව ලබාදෙන්නේ නම්, උන්වහන්සේ අපට ද එලෙසින් කථා කරන සේක)

හබක්කුක් 2:3-4 පදවල ඇත්ත වශයෙන්ම පවසන්නේ "මට පැහැදිලි කිරීමක් තිබේ." යනුවෙන් වන සේක. අපි පැහැදිලි කිරීමක් බලාපොරොත්තුවෙන් සිටින අතර දෙවියන් වහන්සේ ඇදහිල්ල බලාපොරොත්තුවෙන් සිටින සේක. අපගේ ජීවිත තුළ දෙවියන් වහන්සේගේ දේවාරක්ෂාව පිළිබඳ කාරණා හේතුවෙන් ඇතිවන ව්‍යාකුලත්වය ඇදහිල්ල සඳහා දෙවියන් වහන්සේගේ කැඳවීමයි. පැහැදිලි කිරීමක් නොපෙනෙන විට ඇදහිල්ලෙන් ජයගත යුතුය. බොහෝ දෙනෙක් දෙවියන් වහන්සේගේ දේවාරක්ෂාව පිළිබඳ පාසලට වැටෙන නමුත් ඔවුන් දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කරන්නේ උන්වහන්සේ කරන දේ නිසා සහ උන්වහන්සේ එය කරන තාක් කල්ය. එය සහ එය පමණක් ඔවුන්ගේ ඇදහිල්ලේ මනසයි. නමුත් දෙවියන් වහන්සේ අපව එයින් ඔබ්බට ගෙන යාමට උත්සාහ කරන සේක. එවිට අපට උන්වහන්සේව විශ්වාස කිරීමට අවස්ථාව ලැබෙන්නේය. උන්වහන්සේ කරන දේ නිසා පමණක් නොව උන්වහන්සේ දෙවියන් වහන්සේ නිසා අපි උන්වහන්සේව විශ්වාස කළ යුතුය. වෙනත් වචන වලින් පවසන්නේ නම් දෙවියන් වහන්සේ කරන දේ හෝ නොකරන දේ නොසලකා එය උන්වහන්සේගේ චරිතය මත රැඳීමට යොමුවන තෙක් අපගේ ඇදහිල්ල වර්ධනය කිරීමට උත්සාහ කරන සේක.

අපගේ කෙසේද, ඇයි සහ කුමන හේතුවකට ද ? යන ප්‍රශ්න සඳහා දෙවියන් වහන්සේගේ විසඳුම් උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය සහ හේතු පිළිබඳව පැහැදිලි කිරීමක් තුළ නොපැවති ඒවා උන්වහන්සේගේ නිර්දෝෂී අඛණ්ඩතාවය ප්‍රශ්න නොකර ඇදහිල්ල තුළ දක්නට ලැබෙන බව අවබෝධ කරගෙන එම විශ්වාසය ඇතිව දෙවියන් වහන්සේ උන්වහන්සේගේ යුක්තිය, ස්වෛරීභාවය, ප්‍රතික්ෂේප කිරීමක් සහ උන්වහන්සේගේ වචනය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමක් ලෙස පෙනෙන දේවල් සිදුවීමට ඉඩ දුන්නද, යෝබ් මෙන් අපට ද පැවසිය හැකිවිය යුතුය. **"උන්වහන්සේ මා මරණවා ඇත. මට බලාපොරොත්තුවක් නැත්තේය. එහෙත් උන්වහන්සේ ඉදිරිපිට මාගේ මාර්ග හරි බවට සිද්ධ දෙන්නෙමි."** (යෝබ් 13:15) හබක්කුක් පැවසුවේ **"ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත්වේ"** යනුවෙනි.

"ස්වාමීන්වහන්ස, මම ඔබගේ ප්‍රවෘත්තිය අසා භයවීමි. ස්වාමීන්වහන්ස අවුරුදු අතරතුරේ ඔබගේ ක්‍රියාකිරීම ප්‍රාණවත් කළ මැනව. අවුරුදු අතරතුරේ දැන්වුව මැනව. උදහසේදී අනුකම්පාව සිහි කළ මැනව." (හබක්කුක් 3:2) කියා ද හබක්කුක් පැවුවේය. දෙවියන් වහන්සේ කථා කළ දෙය හබක්කුක් ඇසුවේය. මනුෂ්‍යයා වෙනස්වී ඇත. දිගු ගැටුමකින් පසුව ඇදහිල්ල ජයග්‍රහණය කර ඇත. ආත්මීය පැමිණිලිකරුවෙකු වූ හබක්කුක් නමස්කාර කරන්නෙක් බවට පත්වී ඇති අතර එය මුළු දිව්‍ය වාර්තාවේම දකින්නට ලැබෙන වඩාත්ම ජයග්‍රාහී පෙනුමකින් එකක් බවට පත්වී ඇත.

හබක්කුක්ගේ හදවතේ මෙම උසස් බව සටහන් වේ. **"මක්නිසාද අත්තික්කා ගස දළු නෙලූවත්, මුදිකවැලේ වලදාවක් නොතිබුණත්, ඔලීව ගසේ වලහට නොගත්තත්, කෙත්වලින් භෝජන නොලැබුණත්, ගාලෙන් එළු බැටළු රැළ සිඳ දමනු ලැබූවත්, පට්ටිවල ගවයන් නැතුව ගියත්, මම වනාහී ස්වාමීන්වහන්සේ කෙරෙහි සන්තොෂවන්නෙමි. මාගේ ගැලවීමේ දෙවියන් වහන්සේ කෙරෙහි ප්‍රීතිවත් වන්නෙමි. ස්වාමී වූ යෙහෝවහන්සේ මාගේ බලයය. උන්වහන්සේ මාගේ පාද වුවදෙනුන්ගේ පාදවලට සමානකොට, මාගේ උසස්ථාන පිටයන්ට සලස්වන සේක."** (හබක්කුක් 3:17-19)

ඇදහිල්ලේ පැවතීම

කෙසේද, ඇයි සහ කුමන හේතුවකට ද යන දේවල් පහව ගොස් ඇත. බරත් එසේමය. සිතුවිලිවල කැළඹීම පහව ගොස් ඇත. මානසික ගැටුම අවසන්වී ඇත. සැකයේ, අවිශ්වාසයේ වධහිංසාව සහ සියලු වරදවා වටහාගැනීම් ඉක්මවා යන දෙවියන් වහන්සේගේ සමාදානයට මඟපෑදී ඇත. ව්‍යාකුල අනාගතවකතෘවරයා තවදුරටත් ව්‍යාකුල නොවේ. හබක්කුක් ඇදිහල්ල මත පැවතීමට ඇතුළත්වී සිටියි. කෙසේ වෙතත්, ඔහුට මුහුණදීමට අපහසුතා තිබේ. දුෂ්ඨයන් තවමත් ඔහු වටා සිටිති. ඔහුගේ තත්ත්වයන් වෙනස් නොවේ. දෙවියන් වහන්සේ සෑමවිටම අපගේ තත්ත්වයන් වෙනස් කිරීමට තෝරා ගන්නා සේක. උන්වහන්සේ අපව වෙනස් කිරීමට එම වාතාවරණයන් භාවිතා කරන සේක. අප වෙනස් වූ පසු අපගේ තත්ත්වයන් වෙනස්වේද ..? නැද්ද ..? යන්න එතරම් වැදගත් නොවේ.

ඇදහිල්ලේ ශක්තිය

"දෙවියන් වහන්සේ මාගේ ශක්තියයි" කියා කියන්ට පුළුවන් තත්ත්වයට හබක්කුක් පැමිණියේය. ඇදහිල්ල තුලින් දෙවියන් වහන්සේ ඔහුගේ ඕනෑම සිදුවීමකට ශක්තිය වූ සේක. ආනගතවකතෘ තමාගේ දෙපා මුවදෙනෙකුගේ පාද ලෙස වෙනස් වන බැවින් ඔහු භියවන්නේ නැත. (හබක්කුක් 3:19) අනාගතවකතෘගේ කල්පනාවේ ඇත්තේ මුවදෙනයි. ස්ථීර පාද ඇති මෙම සතාට දුෂ්කර කඳුකර භූමි ප්‍රදේශයක ඉතා පහසුවෙන් ගමන් කිරීමට සහ පැන යාමට හැකිය. වන මෘගයන් ලුහුබඳින විට එයින් ගැලවීම සඳහා උපයෝගී කරගන්නේ මෙයයි. " කාව ගිලගනිම්දැයි සොයන ගොරවන සිංහයා" විසින් ලුහුබඳින විට දෙවියන් වහන්සේ මගේ දෙපා මුවදෙනෙකුගේ දෙපා මෙන් කරන සේක. දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තභාවය කෙරෙහි ඇදහිල්ලෙන් බලාසිටීම තුලින් දිව්‍යමය හැකියාවන් ලැබේ. පෙනෙන ආකාරයට ජය ගැනීමට නොහැකි දුෂ්කර අවස්ථාවලදී ඇදහිල්ල මෙසේ පවසනු ඇත. "ස්වාමී වූ දෙවියන් වහන්සේ මගේ ශක්තියයි." හබක්කුක් ඇදහිල්ලේ ශක්තියට ඇතුලුවී ඇත.

කෙසේ වෙතත්, ආනගතවකෘවරයා තම ව්‍යාකුලත්වයන් පරාජය කිරීමෙන් ලැබූ පුද්ගලික ජයග්‍රහණය ගැන සෑහීමකට පත්නොවේ. ඔහු ඇදහිල්ලෙන් පිරී ඉතිරී ගොස් ඇති බැවින් ඔහුගේ අත්දැකීම සහ ජයග්‍රහණය අනිත් අය සමඟ බෙදා ගැනීමට පෙළඹේ. එබැවින් ඔහු තම පණිවිඩය අවසානයේ ගායනාකාරයන්ගේ නායකයා වෙතට හැරී සංගීත භාණ්ඩ වාදනය කරමින් ඇදහිල්ලේ ගීතය ගායනා කරන මෙන් ඔහුට උපදෙස් දෙනු ලබයි. (හබක්කුක් 3:19) ඇදහිල්ල ගායනා කරනු ලබයි. ඔහුගේ ගීතයෙන් **"මම ජයගන්නා පිණිස"** යන අපූරු කියමනක් ඇත. ඇදහිල්ල ජයගනියි. රොතර් හැම් විසින් රචිත පරිවර්තනයක මෙම පදය **"ප්‍රධාන සංගීතඥයාට මගේ ද්විත්ව වීණාවෙන්"** යනුවෙන් සඳහන් වේ. මෙම ගීතයට තනි වීණාවක් ප්‍රමාණවත් නොවේ. ඇදහිල්ල සංගීතයයි. ඇදහිල්ල තනුවයි. ඇදහිල්ල ගායනා කළ යුතුයි. හබක්කුක් ඇදහිල්ලේ නමස්කාරයට ඇතුළත්වී ඇත. ඔහු අසීරු බරකින් ආරම්භකර ගීතයකින් අවසන් කළේය. හාලේලූයියා

7 පිටුවට

දෙවියන් වහන්සේගේ නිවැරදි දැක්ම

(රිවඩ් ඕවන් රොබට්ස් විසිනි)

පුද්ගලයෙක් දෙවියන් වහන්සේ ගැන, තමන් ගැන, පාපය ගැන සහ තමන්ගේ ගැලවීම ගැන සිතන දේ අතර බලවත් සම්බන්ධතාවයක් පවතියි. දෙවියන් වහන්සේ ශුද්ධ ලියවිල්ලෙහි තමන්වහන්සේ ගැන හෙළිදරව් කරන හෙළිදරව්වට වඩා බෙහෙවින්ම පහළින් ඇති දැක්මකට බොහෝ දෙනෙක් ඉඩ හරිති. දෙවියන් වහන්සේ තමන්වහන්සේ ගැන බයිබලයේ විස්තර කරන්නේ, **"මම යව් සේ සිටිමි ද එසේම සිටීමි..."** (නික්මයාම 3:14) **"මක්නිසාද ස්වාමීන්වහන්සේ වන මම වෙනස් නොවෙමි...."** (මලාකි 3:6) **"මක්නිසාද මා ශුද්ධව සිටින හෙයින් ...."** (1 පේත්‍රුස් 1:16) **"ස්වර්ගය සහ පෘථිවිය මාගෙන් පිරී තිබෙනවා නොවේදැයි ස්වාමීන්වහන්සේ කියන සේක."** (යෙරමියා 23:24) **"මාගේ මුළු කැමැත්ත ඉෂ්ට කරන්නෙමි...."** (යෙසායා 46:10) **"මම නුඹේ ක්‍රියාවල් දනිමි...."** (එලිදරව් 2:2) **"ස්වාමීන් වහන්සේ කියන සේක මාගේ ඉදිරිකරුයන්ගෙන් මම නිදහස්වී මාගේ සතුරන්ගෙන් පළිගන්නෙමි."** (යෙසායා 1:24) උන්වහන්සේ කිසිවිටෙකත් පාපයට මෘදු ලෙස හෝ සදාකාලිකව පුසතැවිලි නොවන පව්කාරයින්ට ප්‍රේම කරන ලෙස නිරූපණය කරන්නේ නැත. උන්වහන්සේ මනුෂ්‍යයා සමඟ තමන්වහන්සේව වාසිදායක ලෙස සන්සන්දනය නොකරයි. නුමුත් අපගේ සිතුවිලි උන්වහන්සේගේ සිතුවිලි නොවන බවත්, අපගේ මාර්ග උන්වහන්සේගේ මාර්ග නොවන බවත් බොහෝ ආකාරවලින් අවධාරණය කරනු ලබයි.

දෙවියන් වහන්සේ උන්වහන්සේගේ අවශ්‍යතාවය අඟවන්නේ නැත. නමුත් අපට උන්වහන්සේව අවශ්‍යවන්නේ ඇයි කියා අවධාරණය කරන සේක. උන්වහන්සේ අපගේ ජීවන රටාවට අනුගත නොවන නමුත් අපගේ මාර්ග උන්වහන්සේගේ මාර්ගයට අනුගත වන ලෙස ඉල්ලා සිටියි. බොහෝ දෙනෙකුගේ සිතුවිලිවලට පටහැනිව දෙවියන් වහන්සේ මෘදු හුරුබුහුටි ජීවියෙකු බවට වෙනස් වී නැත. නමුත් උන්වහන්සේ පොළොව ජලයෙන් යටකර නෝවාගේ කාලයේ ශිෂ්ඨාචාරය විනාශ කළ විට සහ සොදොම ගොමෝරාව මත ස්වර්ගයෙන් ගින්න සහ ගෙන්දගම් වැගිර වූ විට මෙන් දැනුත් ධර්මිෂ්ඨ කෝපයෙන් පිරී සිටින සේක. මෘදු මොළොක් යේසුස් වහන්සේම දෙවියන් වහන්සේ වන අතර ලියන්නෙනි, එරිසිවරුනි, වංචාකාරවූ නුඹලාට දුක්වේ. යනුවෙන් ප්‍රකාශ කර සර්පයෙනි, පොළොං වංශය නුඹලා නිරයෙ ශාපයෙන් බේරෙන්නේ කෙසේදැයි ඇසුවොත් උන්වහන්සේම වන සේක. (මතෙව් 23:23-33) මෙම ක්‍රිස්තුස් වහන්සේම කොරාශින් සහ බෙත්සයිදා නගරවලට මෙසේ පැවසූ සේක. **" කොරොශින් නිට දුක්වේ. බෙත්සයිදා නිට දුක්වේ. තොප ඇතුලේ කරන ලද ආශ්චර්‍ය ක්‍රියා තීර් හා සීදොන් ඇතුලේ කරන ලද්දේ නම් ඒ නුවරවල් බොහෝ ඉහත කී ගෝනිතෙදි අද අලුයෙහි ඉඳ පසුතැවිල්ලට පැවිණෙනවා ඇත."** (මතෙව් 11:21-22) එම අවස්තාවේම අනතුරු අඟවමින් ... **"එච්බා කපර්නවුම, තී ස්වර්ගය දක්වා උසස් කරනු ලබන්නීද ? තී පාතාලය දක්වා හෙළනු ලබන්නීය. තී ඇතුලේ කරන ලද ආශ්චර්‍ය ක්‍රියා සොදොම ඇතුලේ කරන ලද්දේ නම් අද දක්වා ඒක පවතිනවා ඇත. එසේවී නමුත් විනිශ්චය දවසේදී තිට වඩා සොදොම් රටට ඉවසන්ට පහසුවන්නේ යයි කියවියි කී සේක."** (මතෙව් 11:23-24) එමෙන්ම මෙයත් අමතක නොකරන්න. **"මක්නිසාද උසස් වූ, උත්කෘෂ්ඨ වූ, සදාකාලයෙහි වසන්නාවූ ශුද්ධය යන නාවය ඇති තැනැන්වහන්සේ මෙසේ කියන සේක. මම උසස් වූ, ශුද්ධ වූ ස්ථානයෙහි ද යටහතැන්ගේ ආත්මය ප්‍රාණවත් කරන්ටත් පොඩිවී සිටින්නන්ගේ සිත ප්‍රාණවත් කරන්ටත් තැලුනා වූ යටහත් ආත්මයක් ඇත්තා සමඟ වාසය කරමි."** (යෙසායා 57:15)

තමන් ගැන නිවැරදි දැක්මක්

බයිබලයේ දක්වා ඇති පරිදි දෙවියන් වහන්සේ පිළිබඳ උසස් දැක්මක් පවත්වා ගන්නා වූ සෑම පුද්ගලයෙකු තමන් ගැන ඊට අනුරූපව පහත් දැක්මකට යොමුව සිටියි. ශුද්ධ වූ නාමයක් ඇති එකම ශ්‍රේෂ්ඨ වූ උසස් හා උතුම් තැනැන්වහන්සේ කෙරෙහි ඇස් යොමුකර ඇති විට කිසිම මනුෂ්‍යයෙකුට තමාගේම ඇසි හමුවේ තමා උතුම් විය නොහැකිය. අනිත් අතට දෙවියන් වහන්සේ පිළිබඳ පහත් දැක්මක් තමා පිළිබඳ අධික ඉහළ දැක්මක් ප්‍රවර්ධනය කරයි. මනුෂ්‍යාගේ උඩඟුකමේ ගැටලුව කිසිවිටෙකත් ක්‍රෑ ක්ෂමව විසඳාගත නොහැකිය. ඇත්ත වශයෙන්ම දෙවියන් වහන්සේ පිළිබඳ උසස් දැක්මකින් හැර අනි කිසිදු පෙළඹවීමක් යටහත්වීමට හේතු නොවේ. අතිවිශාල මිනිස් පාප සංඛ්‍යාවක් උඩඟුකම තුලින් පැන නගින අතර එය **"පාපය උපදවන පාපය"** ලෙස හැදින්වේ. එමෙන්ම උඩඟුකම උඩඟු පව්කාරයන් සහ උඩඟු පව්කාරයන් අතරත්, උඩඟු පව්කාරයන් සහ නිහතමානී සාන්තුවරයන් අතරත්, උඩඟු පව්කාරයන් සහ දෙවියන් වහන්සේ අතරත් ජයගත නොහැකි බිත්තිය ඉදිකරන **"ඉදිරිගමන අහුරන පාපය"** ලෙසද හැදින්වේ.

පාපය පිළිබඳ දැක්ම

තමා පිළිබඳව උසස් දැක්මත් සෑමවිටම පාපය පිළිබඳව විකෘති දැක්මකට මගපාදයි. උඩඟු පව්කාරයා තමාට පිළිගත හැකි සහ පිළිගත නොහැකි හැසිරීම් මොනවාද යන්න තිරණය කිරීමේ අයිතිය තමාටම ඉල්ලා සිටියි. ඔහුගේ උඩඟුකමේ පාපය පිළිබඳව දෙවියන් වහනසේගේ නිර්වචනයට හිස නැමීමට ඔහුට ඉඩ නොදෙන අතර ඔහුගේ අහංකාරය දෙවියන් වහන්සේගේ තර්ජනය, අනතුරු ඇඟවීම් නොසලකා හැරීමට ඔහුට හැකියාව ලබාදෙයි. අපේක්ෂා කළ යුතු පරිදි හරි වැරැද්ද තීරණය කිරීමේ දී දෙවියන් වහන්සේට යටත්වීමට හැකියාවක් නොමැත බැවින් දසපනතේ අඩංගු ලිඛිත නීති රීති ඔහු ඉවසන්නේ නැත. තවත් මනුෂ්‍යයෙකුට සවන්දීමට කැමැත්තක් නැත. ඔහු අනාගතවකතෘවරයෙකු, පූජකයෙකු හෝ දේශකයෙකු වේවා ඔහු කළ යුතු සහ නොකළ යුතු දේ ඔහුට කියන්න. ඔහුගේ උඩඟුකම නිසා පසුගිය පරම්පරාවල අතිවිදින ලද පාපයේ භයානක ප්‍රතිවිපාක පිළිකුල් කරන අතර පෙර සියවස්වල ප්‍රඥාවන්ත සහ යහපත් මිනිස්සු වලංගු බව ඔප්පු කර ඇති සියලුම සත්‍යයන් සම්පූර්ණයෙන්ම නොසලකා හරිමින් තමාගේම නිදහස් මාර්ගය සාදා ගනිති. මක්නිසාද ඔහු තම පාපවල ප්‍රමාණය පුරවන අතරතුර විනාශය ද ප්‍රමාද වන බැවින් (1 තෙසලෝනික 2:16) සහ දෙවියන් වහන්සේගේ උදහස තවමත් ඔහු කෙරෙහි උපරිමයට පැමිණ නැති නිසා අනෙක් අය ඔහුගේ විනාශකාරී මාර්වලට ආකර්ෂණය වී ඔහුගේ වැරදි සහ අයුතුකම් අනුකරණය කරති. ලෝකයේ සහ සභාවේ උඩඟුකම පවතින බැවින් පාපය පිළිබඳ නව අර්ථකතන නිකුත් කරන අතර පරිහානිය දේශය පුරා පළගැටියන්ගේ හමුදාවක් මෙන් ගමන් කරයි.

ගැලවීම පිළිබඳ නිවැරදි දැක්මක්

පාපය පිළිබඳ විකෘති දැක්මක් ස්වභාවිකවම ගැලවීම පිළිබඳව දූෂිත දෘෂ්ඨියකට මගපාදයි. මිනිස් අර්ථ දැක්වීම්වලට අනුව පාපය සුළු විපාකයක් නම් දෙවියන් වහන්සේගේ ප්‍රමාණයේ ගැලවීමක අවශ්‍යතාවය ඉවත්කරනු ලැබේ. පාපය නොවැදගත් කාරණයක් නම් ගැලවීම කුඩා මිණුමකින් ප්‍රමාණවත් යැයි සැලකේ. බේදවාචකයක් ලෙස බොහෝ කිතුණුවන්ට ඔවුන්ගේ ගැලවීම ඉතා සුළුදෙයක් හැර අන්කිසිවක් නොවන බවට පෙනෙන සාක්ෂි අධිකය.

දෙවියන් වහන්සේ පිළිබඳ අපගේ දැක්ම නිවැරදි වූ විට තමන් පිළිබඳ අපගේ දැක්ම ඉතා පහත් වන අතර අපි උන්වහන්සේ ඉදිරියේ කිසිවක් නොවන බව අපට දැකගත හැකිය. මෙම ශූන්‍යතාවයේ හැඟීම බලාපොරොත්තු සුන්වීමට හේතු නොවී අපගේ මුළු හදවතින්ම උන්වහන්සේ කෙරෙහි ආශා කිරීමට අපව පොළඹවනු ඇත. අපව උන්වහන්සේ වෙනුවෙන්ම මැවූ පියාණන් වහන්සේගෙන් අපව ඈත්කර ඇති බවට ඇති මෙම මහත් හැඟීම උන්වහන්සේගේ කරුණාවේ සැබෑ අත්දැකීමකට වඩා අඩු දෙයකින් තෘප්තිමත් කළ නොහැකි උන්වහන්සේගේ සමීපත්වය සඳහා ආශාවන් අප තුළ ඇති කරයි. දෙවියන් වහන්සේ කෙරෙහි ඇති කුසගින්න සහ පිපාසය අතිශයින් බලවත් වූ විට උන්වහන්සේගේ අනුගහය සොයා ගැනීමට සහ උන්වහන්සේ වෙතට ළංවීමට කිසිදු මිලක් අධික නොවේ. උන්වහන්සේට සමීපව මෙම තත්ත්වයන් යටතේ අපගේම ප්‍රමිතීන්ට හෝ අප වටා සිටින දුෂ්ඨයන්ගේ ප්‍රමිතීන්ට අනුව පාපය මැනීමට අපි එඩිතර නොවෙමු. අපට පාපය සම්පූර්ණයෙන්ම පිළිකුල් සහගත වනු ඇති අතර ආබාධිත දරුවෙකු අලුත් ශරීරයක් සඳහා ආශා කරනවාට වඩා පාපයෙන් මිදීමට අපි ආශා කරන්නෙමු. දෙවියන් වහන්සේ කෙරෙහි දැඩි ඇල්මක් ඇති කිසිම මනුෂ්‍යයෙක් කම්මැලි ආගමෙන් සෑහීමකට පත්නොවනු ඇත. නැතහොත් සර්වබලධාරී දෙවියන් වහන්සේගේ ගැලවීමේ සැලැස්මට වඩා අඩු හෝ වෙනස් වූ ඕනෑම ගැලවීමේ සැලැස්මක් සඳහා ඔහුගේ හදවතේ ඉවසීමක් සොයානොගනු ඇත. මේ අනුව දවසේ ඉහළම ප්‍රමුඛතාවය විය යුත්තේ මුළු බයිබලයේම දෙවියන් වහන්සේ වෙතට සම්පූර්ණයෙන්ම නැවත පැමිණීමයි.

දෙවියන් වහන්සේ කෙරෙහි භය

(ජෝන් ගිල් විසිනි - 1697-1771)

"සියල්ල අසන ලද්දි. වුලු කාරණයේ තීන්දුව නව් වේය, දෙවියන් වහන්සේට භයව උන්වහන්සේගේ ආඥා පවත්වාපන්න. වේ වනාහී සියලු වනුෂ්‍යයන්ගේ යුතුකමය." (දේශනාකාරයා 12:13)

දෙවියන් වහන්සේට භයවීම දිව්‍ය නමස්කාරයේ දී ඉතා වැදගත් කාරණයක් වන අතර සමහර විට (දේවභය) සම්පූර්ණයෙන්ම යෙදවීම අදහස් වේ. දෙවියන් වහන්සේට භයවන කෙනෙකු විසින් බොහෝ විට ශුද්ධ ලියවිල්ලෙහි දෙවියන් වහන්සේට නමස්කාර කිරීම විස්තර කර ඇත. ප්‍රඥාවන්තයාට අනුව මුළු ආගමික ක්‍රියාවලියම මෙම කාරණා දෙකට එනම් දෙවියන් වහන්සේට භයවීමට සහ උන්වහන්සේගේ ආඥා පිළිපැදීමට අයත්ව තිබේ. දෙවියන් වහන්සේට භයවීමෙන් නමස්කාරය ප්‍රකාශවන බැවින් එය සිදු කළ යුතු ආකාරය සහ ඒ සමඟ සිටීමට යොමු කෙරේ. එහෙයින් සොලවන්ට බැරි රාජ්‍යයක් ලබන්නා වූ අපි ගෞරවයෙන් ද, දේවභයින්ද දෙවියන් වහන්සේට ප්‍රසන්න වන ලෙස සේවය කරන පිණිස අනුග්‍රහය (ස්තුතිවන්තකම) ඇතුව සිටිමු. (හෙබ්‍රෙව් 12:28)

දේවභය ප්‍රකාශවෙන ආකාරයන්

• පාපයට වෛරකිරීමෙන්

"ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීම නව් නපුරට ද්වේෂ කිරීමයි. උඩඟුකමටත් අහංකාරයටත් නපුරු මාර්ගයටත් ප්‍රයෝග වුඛයටත් ද්වේෂ කරමි." (හිතෝපදේශ 8:13) "ප්‍රේමය වංචාරහිත වේවා. නපුරට

8 පිටුවට

Reg. No: Dop/News/33/2025
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

7 පිටුවෙන්

දෙවියන් වහන්සේ කෙරෙහි භය...

පිළිකුල්කොට යහපතට ඇලුවිවෙයල්ලා.” (රෝම 12:9) දෙවියන් වහන්සේට භයවන, උන්වහන්සේට ගෞරවණීය සෙනෙහසක් ඇති මනුෂ්‍යයෙක් උන්වහන්සේට පටහැනි දෙයක් ලෙස නපුරට වෛර කරනු ඇත. (ගීතාවලිය 9:10) එවැනි මනුෂ්‍යයෙක් නපුරු සිතුවිලි, නපුරු වචන, නපුරු ක්‍රියා සහ නපුරු හා බොරු මාර්ගවලට, කෙටියෙන් පැවසුවහොත් ස්වභාවෙයන්ම නපුරු සියල්ලට වෛර වෙති. පාපය සෑම ආකාරයකින්ම පාපිෂ්ඨ වේ. දෙවියන් වහන්සේගේ නීතිය උල්ලංඝනය කිරීමක් සහ උන්වහන්සේගේ ස්වභාවයට පටහැනි බැවින් උන්වහන්සේගේ ධර්මිෂ්ඨ ආත්මය එම පිළිකුල් සහගත දෙයට වෛර කරයි.

● නපුරෙන් ඉවත්වීමෙන් එය පෙන්නුම් කරයි.

“..... ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීමෙන් මනුෂ්‍යයෝ නපුරෙන් දුරුවෙති.” (හිතෝපදේශ 16:6) “නුඹ ඥානවන්තයෙකැයි සිතා නොග නින්න. ස්වාමීන්වහන්සේ කෙරෙහි භවය නපුරෙන් දුරුවෙයන්න.” (හිතෝපදේශ 3:7) විවෘත හා ප්‍රසිද්ධ පාපවලින් පමණක් නොව පුද්ගලික හා රහසිගත පාපවලින් ද, එවැනි අයෙකු නපුරේ සියලු පෙනුමෙන් හා එයට මඟපෙන්වන සියලුම දේවලින් වැලකී සිටිනු ඇත. එයට හසුවීමට නැඹුරුවෙන සෑම මාර්ග යක්ම, සෑම අතුරු මාර්ගයක්ම මගහරිනු ඇත.

“දුෂ්ඨයන්ගේ මාවතට ඇතුල් නොවන්න. නපුරු විනිසුගේ මාර්ගයෙහි ගමන් නොකරන්න. එයින් වැළකී, එහි නොගෙස්, එයින් අහකට හැරී පලයන්න. ” (හිතෝපදේශ 4:14-15) යන ප්‍රඥාවන්ත මනුෂ්‍යයාගේ උපදෙස් ලබාගනියි.

දෙවියන් වහන්සේ කෙරෙහි ඇති භය මනුෂ්‍යයන් තුළ ප්‍රකාශවන්නේ තමන් කලින් කළ දේ කිරීමට ඉඩනොදීම සහ අන් අය කරන දේ නොකර සිටීමයි. නෙහෙමියා කලින් සිටියා වූ දිසාපතිවරු, ආණ්ඩුකාරවරු කරන ලද අයහපත් දේවල් ගැන කථාකරමින්, ***“නුවුත් මට ඉස්සරින් සිටි පළවු දිසාපතිවූ සෙනඟට බරක්වී කෑවත් ව්‍යුදිකපානයත් හැර රිදී ෂෙකෙල් හතලිහකුත් ගත්තෝය. එසේය ඛවුන්ගේ සේවකයෝ පවා සෙනඟ කෙරෙහි ආණ්ඩු කළෝය. එහෙත් මම දෙවියන් වහන්සේ කෙරෙහි භය ඇතුව සිටින නිසා එසේ නොකළෙවි. ”*** (නෙහෙමියා 5:15) යැයි පැවසුවේය. දේවභය ඇති අය පාපයෙන් තොර වූ අය නොව නමුත් ඔවුන්ට අනිත් අය කරන පාපවලට තමන්ගේ ජීවිතවලත් නිදහසේ පැවතීමට ඉඩහැරිය නොහැකිය. අන්‍යජාතීන් ගමන් කරන්නාක් මෙන් ගමන් කළ නොහැකිය. මනසෙහි නිශ්චලතාවයෙන් (තමා ගැන අති මාන්නයෙන්) පව්කාර ජීවන රටාවකින් පැවතිය නොහැකිය. ක්‍රිස්තුස් වහන්සේ ගැන සහ දෙවියන් වහන්සේගේ කරුණාව ගැන අනිත් කාරණා ඔවුන්ට උගන්වනු ලබන සේක.

● දෙවියන් වහන්සේට හෝ මනුෂ්‍යයාට අමනාප නොවීමට ප්‍රවේසම්වීමෙන් දේවභය ප්‍රකාශ වේ.

දෙවියන් වහන්සේට විරුද්ධ නොවීමට පමණක් නොව ඊට අමරව වචනයෙන් හෝ ක්‍රියාවෙන් දේවදරුවන්ට විරුද්ධව අමනාප නොවීමට සහ කිසිවෙකු ඉදිරියේ කිසිදු බාධාවක් නොතැබීම ඔවුන් වගබලා ගනියි.

● මනුෂ්‍යයා තුළ දේවියන් වහන්සේ කෙරෙහි භය ඇතිවීම කරුණුකොටගෙන දෙවියන් වහන්සේට නමස්කාර කිරීමට නිරන්තරයෙන් සහභාගිවීමට සහ උන්වහන්සේගේ කැමැත්ත කෙරෙහි දැඩි සැලකිල්ලක් දැක්වීම නිර්ක්ෂණය කළ හැකිය.

දෙවියන් වහන්සේට භය ඇති අයට උන්වහන්සේට නමස්කාර කිරීම නොසලකා හැරීම පහසු දෙයක් විය නොහැකිය. එම නිසා ඔවුන් දෙවියන් වහන්සේගේ කැමැත්ත පිළිබඳව දැනුමෙන් පූර්ණව සිටීමට කැමති පරිදි නමස්කාරය ක්‍රියාවට නැංවීම සොයා ගැනීමටත් සෙකරියස් සහ එළිසබෙත් මෙන් ස්වාමීන් වහන්සේගේ සියලු නියෝග සහ ආඥා පිළිපැදීමටත් නිර්දෝෂීව ගමන් කිරීමටත් යොමුවෙති.

● දෙවියන් වහන්සේට භය ඇති මනුෂ්‍යයන් තුළ දකින්නට ලැබෙන්නේ සහ දැනගත හැකිවන්නේ ඔවුන් දෙවියන් වහන්සේගෙන් කිසිවක් වළක්වා නොගෙන දෙවියන් වහන්සේ ඔවුන්ගෙන් ඉල්ලා සිටින සෑම අවස්ථාවකදීම උන්වහන්සේට ඉතා ප්‍රේමනීයව සිටින බවයි.

එබැවින් ආබ්‍රහම් දෙවියන් වහන්සේගේ ආඥාව පරිදි තම පුත්‍රයාව ඉතා කැමැත්තෙන් පූජා කළ විට උන්වහන්සේගෙන් මෙම සාක්ෂිය ලබාගත්තේය. ***“නුඹේ අත නරුණයා පිට නොතබව, ඛහුට කිසිවක් නොකරව, වක්නිසාද නුඹේ පුත්‍රයා, නුඹේ එකම පුත්‍රයා මාගේ නොවැළැක්වූ බැවින් නුඹ දෙවියන් වහන්සේට භයවන බව දැන් දනිමියි කීයේය.”*** (උත්පත්ති 22:12)

● දේවභය ඇතිවීමට හේතු සහ එහි උල්පත් ගලා එන්නේ කොහෙන්ද ?

“එය මනුෂ්‍යයන් තුළ ස්වභාවයෙන්ම ඇතිවන දෙයක් නොවේ.” එහි ඌණතාවය සහ දූෂිත ස්වභාවය මනුෂ්‍යයා පිළිබඳව විස්තර කිරීමේ කොටසකි. ***“ ඛවුන්ගේ ඇස් හමුයෙහි දෙවියන් වහන්සේ කෙරෙහි භයක් නැත යනුයි.”*** (රෝම 3:18)

“එය දෙවියන් වහන්සේගේ කරුණාවෙන් හටගත්තේය.” එය කරුණාවේ ත්‍යාගයක් සහ ප්‍රදානයකි. “අහෝ ඛවුන්ට ද ඛවුන් සමඟ ඛවුන්ගේ දරුවන්ට ද සදාකාලේටම ශුභ සිද්ධ වෙන පිණිස නිතරම මට භයවීමටත් මාගේ සියලු ආඥා රක්ෂා කිරීමටත් වෙයාකාර සිතක් නිබුණොත් යහපත.” (ද්විතීය කථාව 5:29) දෙවියන් වහන්සේට හැර වෙන කිසිවෙකුට එවැනි හදවතක් දිය නොහැකි අතර උන්වහන්සේ එය ගිවිසුමකින් පොරොන්දු වී ඇත. ***“ඛවුන්ටත් ඛවුන්ට පසු ඛවුන්ගේ දරුවන්ටත් ශුභසිද්ධවෙන පිණිස සෑම කල්හිම මා කෙරෙහි භයවීමට එක සිතක් ද එක මාර්ගයක් ද ඛවුන්ට දෙන්නෙමි. මම ඛවුන් වෙතින් අහකට නොහැරී, ඛවුන්ට යහපත කරන හැටියට ඛවුන් සමඟ සදාකාල ගිවිසුමක් කොට, ඛවුන් මා වෙතින් අහක්ව නොයන ලෙස මා කෙරෙහි භයවීම ඛවුන්ගේ සිත්වල නඛන්නෙමි.”*** (යෙරමියා 32: 39-40)

“එය ඉටුකර ගැනීමට හැකි මාධ්‍යයන් වන්නේ දේව වචනය සහ යාච්ඤාවයි.” ස්වාමීන්වහන්සේ කෙරෙහි භයවීම යුතුකමක් සහ නමස්කාරයේ ප්‍රකාශනයක් වන බැවින් එය ඉගෙනගත යුතුයි. ***“ දරුවෙනි, එව මට කන්දෙව්. ස්වාමීන් කෙරෙහි භයවීම තොපට උගන්වන්නෙමි.”*** (ගීතාවලිය 34:11) දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව සහ විශේෂයෙන් සම්පූර්ණ ඉවැන්ජලිකල් නීතිය යන කාරණා දෙකම ඉගෙනගත යුතුයි. (ගීතාවලිය 86:11, හිතෝපදේශ 2:3-5)

දෙවියන් වහන්සේගේ කරුණාව සහ යහපත්කම පිළිබඳව නව සොයාගැනීම් එය දිරිමත් කරමින් ප්‍රවර්ධනය සහ වැඩිදියුණු කරනු ලැබේ. ඔවුන් ස්වාමීන්වහන්සේට සහ උන්වහන්සේගේ යහපත්කමට භියවනු ඇත. දෙවියන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද, ප්‍රදර්ශනය කරන ලද සහ අදාළ කරන ලද යහපත්කම උන්වහන්සේ කෙරෙහි භය ඇති අයට බෙහෙවින්ම බලපාන්නේය. (හොෂෙයා 3:5) විශේෂයෙන් උන්වහන්සේගේ සමාව දෙන කරුණාව සහ දයාව යොදවන සේක. ***“නුවුත් ඛබ කෙරෙහි භය ඇතුව සිටින පිණිස ඛබ වෙත කමාව ඇත්තේය. ”*** (ගීතාවලිය 130:4)

ස්වාමීන් වහන්සේ කෙරෙහි භය ඇත්තන්ගේ සන්තෝෂය

ආත්මික දේවල් සම්බන්ධයෙන් ස්වාමීන් වහන්සේට භියව සිටින අයට බොහෝ දේ පොරොන්දු වී ඇති අතර ඔවුන් වඩාත් සන්තෝෂවන්නා වූ පුද්ගලයන් ලෙස හඳුන්වනු ලැබේ. ස්වාමීන්වහන්සේ තමන්වහන්සේ කෙරෙහි භය ඇත්තන් ගැන ප්‍රසන්න වෙමින් ඔවුන් පිළිබඳව අතිශයින්ම ප්‍රීතිවන සේක. (ගීතාවලිය 147:11)

● “උන්වහන්සේ ඔවුන්ව පිළිගනු ලබන අතර උන්වහන්සේට පිළිගත හැකිය.”

පේතෘස් මෙලෙස පැවසුවේය. ***“එවිට පේතෘස් මුඛය හැර කථාකොට, සැබවින් දෙවියන් වහන්සේ මනුෂ්‍යයන්ගේ තරාතිරම් නොබලන කෙනෙක්ය. සියලු ජාතීන් අතරේ උන්වහන්සේ කෙරෙහි භය ඇතිව ධර්මිෂ්ඨකම් කරන තැනැත්තේ උන්වහන්සේට ප්‍රසන්න බව සැබවින්ම වට පෙනේ.”*** (ක්‍රියා 10:34-35) ප්‍රේමවන්ත ක්‍රිස්තුස් වහන්සේ තුළ උන්වහන්සේ සමඟ උන්වහන්සේගේ සෙනඟව පිළිගනු ලබන අතර ඔවුන්ගේ යාච්ඤා සහ ප්‍රශංසා පූජාවන් යේසුස් වහන්සේ තුලින් දෙවියන් වහන්සේට පිළිගත හැකිව තිබෙන සේක.

ඉතිරි කොටස ඊලඟ කලාපයෙන්

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

“ස්වාමීන් වහන්සේ අප උදෙසා මහත්දේ කළ සේක. එබැවින් අපි සන්තෝෂවෙමුව.” (ගීතාවලිය 126:3)